

'දැය එළු බස හා - නොකරන පණ යා

4 වෙළුම | 1963 අගෝස්තු - 2507 නිකිණි | 5 කලබ



පටුන

බසේ ලකර

පිරිසිලනය — ඊලියන් ද සිල්වා
[සොයුත් විදු (B. Sc. (Eng.) Lond.)
A. M. I. E E.]

සිංහල භාෂාවට සතුරු
වන්නෝ කවුරු ද? — ජයන්ත වීරසේකර

ගැලැවීම (අන්දරයෙකි) — අජිත

පාරිභාෂික පටලැවිල්ල —

සුනිල් සාන්තයන් හා හෙළ
මියැසිය — කුමරසිහි කිත්සිරි

එළුව — ජ. තෙන්නකෝන්

දුහුන පබඳ —

එඩි වැඩුම (ගීයෙකි) — සුනිල් සාන්ත

ගැදි තරගය —

පැදි තරගය —

දම් සක — වි. ජ. මු. ලොකුබංඩාර

— (බදුල්ලේ දිසා උසාවියෙහි)

කඳ දෙවි තොහුව —

සෝරත නා හිමි සමරුව —

Technical Terms and
Sinhala — T. D. M. Aelian de Silva
[B.Sc(Eng.) Lond. A. M. I. E. E.
Chartered Electrical Engineer]

නිකිණි මස —

මස්කෙලිය සීතල සී.

එහි

උණුසුම ඇති එකම තැන

(E. H.) කූරේ සහ පුත්‍රයන් ගේ

බීම සාප්පුව සී.

හැටන් පාරේ, මස්කෙලිය – 428.

'එඩිය'

මෙ සේ ඉල්ලන්නැ

සීමා සහිත

ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

කොළොඹ – මහනුවර – ගාල්ල – මීගමුව – අනුරාපුර

බසෙහි ලකර

ලොවේ කවර මැ දූයෙකැ වුව ද, කවර මැ තැනැත්තකු ගේ වුව ද එයට මැ අයත්, ඔහුට මැ අයත් ලකරෙක් වෙයි. 'එහි කිසි ලකයෙක් නැ ඔහු ගේ වැඩවලැ කිසි ලකයෙක් නැ' විසින් අප කියන්නේ මෙන්න මේ ලකර නැති වූ කල්හි යැ. ලොවේ ඇති නන් වගැ දැහි පෙනෙන මේ ලකර හෙවත් ලස්සන ඇති වූයේ, ඇති වන්නේ කෙසේ ද? ඒ ඒ දූය අයත්, එයට මැ හිමි ගුණය මැ සියත් බව මැ මතු වීමෙනි.

ගසෙකැ ලකර එ ගසේ මැ කොළ, මල් පල ආදිය යි. කො තරම් විසල් වුව ද, රිකිලි බෙදුණ ද එයට අයත් නැති කොළ එ ගසට ලකරෙක් නො වේ. අඹ ගසේ කොළ මැ විනා එ කොළ වසා හිස ඔසවා සිටුනා පිළිලයෙහි කොළ අඹ ගසට ලකරෙක් නො වේ.

කො තරම් ලස්සන වුව ද, සුවඳවත් වුව ද එයට අයත් නැති මල එ ගසේ එඩියට පිහුමට කරුණෙක් නො වේ. බුත්සරණ මල සුවඳ නැති බව සැබැවෙකි. එහෙත් එ ගසේ එල්ලූ ගැන්නු රෝස කුසුමෙන් එ ගස සැරසේ ද? නො වෙයි.

පල ගැනැ කියන්නට ඇත්තේ ද මෙ මැ යැ. කොස් ගසේ පල එ ගසට ලකරක් වන්නා සේ මැ පොල් ගසේ පල එ ගසට ලකරෙකි. දෙකෙහි මාරුව විහිළුවෙකි.

කිසි යම් බසක් වුව ද මෙ සේ වෙයි. හෙළ බසින් මූදු කැමට අපි මූදු කැම යැ යි කියමු. කො තරම් බර වුව ද සමුද්‍ර ඛාදනය යන පර වදන ඒ වෙනුවට ගැන්නීම කෙබඳු ද? ගස් වැල්-වෘක්ෂ ලතා, ඉදිරියයු-ප්‍රගතිශීලි, ගොවිකම-කෘෂිකර්මය ඈ වදන් කෙ බඳුද? සිංහල ගොනාට ගොනා යැ යි කියනවා මිසැ වෘෂභයා යැ යි කීම එ සේ කියන්නවුන් සලකා මැ කියනවා නම් විනා එහි ඇති වරදෙක් නැති!

බසේ එඩිය රැකෙන්නේ එ බසේ මැ වද-නිනි. එ හෙයින් පර වදන් යොදන්නේ බසේ එඩිය මකන්නෙකි; ලකර වනසන්-නෙකි; බස නම් කිමැ යි නොදන්නෙකි. "බස මගේ යැ; මම එඩි ඇත්තෙමි; එ හෙයින් බස ද එඩිමත් වියැ යුතු යැ" මෙ සේ සිතන මිනිස්සු අහෝ කොහි වෙත් ද?

එ බන්දෝ තුරිකියේ වූ හ. යුරෝපයේ ලෙඩා නම් ගැනුණු තුරිකියෙහි තුරිකි බසට පිළිල වැ සිටි අරාබි වදන් තෙරපා යළි එ බස නැංවූ **කමාල් පාසා** එ බන්දෙකි. ඊස්රායලයේ ද එ බන්දෝ වූ හ. යුදෙව්වන් ගේ මවු බස මකාගෙනැ නැඟී සිටි අරාබි යිද්දිස්, ලැඩිනෝ යන තුන් බසට මරු පහර දී වසර දෙ දහසෙකින් යට ගිය හීබ්රු වදන් මැ යළි පණ ගන්වා එහි මහ පෙරළිය කළ **එළියසා** බෙන් යුහුද එ බන්දෙකි.

දියුණු වූ හැම රටෙකැ මැ පවත්නා තතු මෙ බඳු යැ. එහෙත් තතුව කෙ බඳු ද අප "ශ්‍රී ලංකාද්වීපයෙහි"? රජයේ බස සිංහල වුව ද එහි සිප් වදන් හදන්නෝ "පාරිභාෂික වැ සිටැ" සකුයෙන්, හින්දියෙන් අඟුයෙන් වහු-යෙන්. ඉංගිරිසියෙන් අමුඅමුයේ බරවා වදන් ගෙනැ හෙළ වදන්හි නැමියාව මකති; බසේ ලකර වනසති; රැසේ එඩිය මඩිති. අඳෝ මැ යි!

අප මේ යන්නේ කොයට ද? කෙළවර කො තැන ද? කෙළවර සකු අඟුවේ හෝ හින්දි පිළිකන්නේ හෝ ඉංගිරිසි පා යටැ හෝ වී නම් කොහි නිදහස?

අප නිදහස් වූයේ අනුනට ගැති වන්නට ද? නැතොත් හිස ඔසවා අපිත් මිනිස්සුමු යි ලොවේ සෙසු දියුණු වූ රුසියා, ඇමෙරිකා, චීන, ජපන්, ඉංගිරිසි ඈ මහ මිනිසුන් අතරැ උදු වැ නැඟී සිටින්නට ද?

පිළිතුර ඔබ අතේ යැ.

පිරිසිසිලනය

ඊලියත් ද සිල්වා

යුම් දූයෙකැ රස්නය ඉවතට ඇදූ එය සිසිල් කැරුම පිරිසිසිලුම යි(Refrigerat -ion). මේ කාරියට යොදවන උවාරණය පිරිසිසිලනය (Refrigerator) නමින් හැඳින්වේ. අහර ඇ දූ නරක් නො වී දිගු කලක් තබා-ගැන්මට පිරිසිසිලනයක් තුළැ තැබුම සිරිත යි. සිසිල් වැ තුබූ කලැ බොහෝ කැවිලි - පෙවිලි කල් පවත්නා හෙයින් එ සේ කැරෙයි. ගර පිරිසිසිලන (Domestic refrigerators) දෙ ගණයකට අයත් වේ. එකෙක් නම් වායුරු-සවුරුම් (Vapour-absorption) යන්න යි. අනෙක නම් වායුරු -පිරිතෙරුපුම් (Vapour - compression) යන්න යි. බහුල වැ වැඩට ගන්නේ වායුරු-පිරිතෙරුපුම් පන්නයේ පිරිසිසිලන වෙයි. එ වන් පිරිසිසිලන වැඩ කරන්නේ මෙ සේ යැ.

එහි නල මඟෙකැ රුඳැවූ ගැසියෙක්(Gas) වෙයි. එ මැ ගැසියට කියනුයේ පිරිසිසිලිය (Refrigerant) කියා යි. පළමුවෙන් මැ,මේ පිරිසිසිලිය සපිරි වැ තෙරුපෙයි.; හෙවත් පිරිතෙරුපෙයි (gets compressed). එ සේ පිරිතෙරුපූ කලැ පිරිසිසිලියෙහි තෙරපුව ද වැඩි වෙයි; රස්නය ද වැඩි වෙයි. සකෙහි (Valve) රත් වන අයුරු බයිසිකලයකට සුළං ගසා ඇත්තෝ දන්නෝයි. සුළඟ තෙරුපූ නිසා යැ එසේ රත් වනුයේ. එ මෙන් මැ පිරිතෙරුපූ පිරිසිසිලිය ද රත් වෙයි. මේ පිරිතෙරුපුම කැරෙනුයේ පිරිතෙරපනය (Compressor) යන උවාරණයෙනි. ඉක්බිති වැ, පිරිතෙරුපූ පිරිසිසිලිය, අදිගනුරුව නම් උවාරණයට ඇතුළු වෙයි. වෙසෙස් ලෙස ගන කරනුයේ යමෙක් ද ඒ 'අදි + ගන + කුරු' හෙවත් අදිගනුරුව යි (Condenser).. එයට ඇතුළු වූ පිරිසිසිලිය ගන බිඳු ලෙසට පෙරුළෙයි හෙවත් අදිගැනිරෙයි (Condenses). එ බැවින්, කලින් ගැසියක් වූ පිරිසිසිලිය දූන් දියරෙකි (Liquid). දියරෙකැ වෙස් ගත්



පිරිසිසිලනය
REFRIGERATOR

පිරිසිසිලිය ඉක්බිති වැ ඇරිම-වැළිවෙයක් (Expansion valve) තුළින් යයි. ඇරිම-වැළිවෙයින් පිටවනුයේ දියරක් ලෙසින් නො වැ තෙත වායුරුවක් (වා + අයුරු, වාෂ්ප, vapour) මෙනි. ඇරිම (Expansion) නිසා පිරිසිසිලියේ රස්නය බෙහෙවින් අඩු වෙයි. බයිසිකලයෙකැ සුළං ඇරි විටැ වැළිවෙය Valve (සිසිල් වනුයේ ද සුළඟෙහි ඇරිම නිසායි. මෙ තෙත වායුරුව (Wet Vapour) ඊළඟට ඇතුළු වනුයේ ඉවායුරුවට යි(Evaporator). දිය බිඳක් මද කලෙකින් හිඳී යනුයේ එය වායුරුවකට හැරී යන නිසා යි. මේ හිඳී යෑමට කියනුයේ ඉවායිරිම (Evap eration) කියා යි. ඉවායුරුවට ඇතුළු වූ පිරිසිසිලිය සැණින් ඉවායිරෙයි(Evaporates)

මේ ඉවායිරීම නිසා පිරිසිසිලිය තවද සිසිල් වේ. එ බැවින් ඉවායුරුවෙහි ඇති රස්නය ඇදූ-ගෙනැ පිරිසිසිලිය රත් වෙයි. මෙ සේ රත් වී යළි ගෑසියෙකැ වෙස් ගනී. ඉවායු-රුවේ රස්නය පිරිසිසිලිය විසින් ඇදූ-ගත් නිසා ඉවායුරුව සිසිල් වේ. ඉවායුරුව පිහිටා ඇත්තේ පිරිපැස (Cabinet) තුළැ යැ. එ බැවින් පිරිපැස තුළෙහි රස්නය ඉවායුරුව ඇදූ-ගනී. ඉන් වනුයේ පිරිපැස ඇතුළත සිසිල් වීම යි. පිරිතෙරපුම, අදිගැනුරුම, ඇරිම, ඉවායුරුව (Compression Condensation, Expansion, Evaporation) යන විසින් පිය සතෙරකින් හෙබි සිය ගමනේ එක් විටක් හමාර කැරැ ඇති පිරිසිසිලිය දූත්. මෙ වන් ගමන් විටක් හඳුන් වනුයේ සකැලිය (Cycle) යනුවෙනි. ත්ම ගමන එක් සකැලි-යෙකින් නිමහම් දකින්නෙක් නො වේ පිරිසිසිලිය. එය කො තෙකුත් යෙයි; සකැලි කිහිපයක් යෙයි; පිරිපැස නිසි පමණ සිසිල් වන තෙක් යෙයි. සිය ගමන කෙළවර වනුයේ එ විටැ යැ.

එ සේ නම් කෙසේ ද පිරිසිසිලිය දන්නේ පිරිපැස සුදුසු පමණ සිසිල් වූ වග? මෙ අතින් පිරිසිසිලයේ ගමන හික්මවන්නේ තැප්සිටුව යි (Thermostat). මේ වෙනස් වහරුවෙකි. වැසීමත්, ඇරීමත්, කැරෙනුයේ යමෙකින් ද ඒ වහරු (switch) නම්. රස්නය අනුවැ ඇරෙන වැහෙන වහරුවෙකි තැප්සිටුව ලෙසින් හඳුන්වනුයේ. එ හෙයින් පෙරැ පැතූ පමණට පිරිපැස සිසිල් වුව තැප්සිටුව ඇරෙයි. පිරිතෙරපනයේ විදිලි බමවනයට (Electric motor) එන විදිලි දහර ඉන් අත්-හිටැවෙයි; පිරිතෙරපනය නවතී. පිරිසිසිලිය පිරිතෙරපන්නට කෙනෙක් නැති. එ බැවින් පිරිතෙරපනය යළි වැඩ කරන තෙක් පිරිසිසි-ලිය ඉසුඹු ලබයි. නැවැතැ පිරිතෙරපනය වැඩ කරනුයේ තැප්සිටුව වැසුණු විටැ යැ. තැප්සිටුව වැහෙනුයේ පිරිපැසෙහි සිසිල පෙරැ පැතූ පමණට වඩා අඩු වුව හොත් පමණි.

නම් පන්නයේ පිරිසිසිලනයන්හි, බමවනය ද පිරිතෙරපනය ද වෙන් වෙන් වැ එළියේ පිහිටා නැති. බමවනයත්, පිරිතෙරපනයත් එක් මැ පැසෙහි ලා වායුව පිට නොවන සේ සවරා (ස + වරා, Sealed) ඇති. මෙ මැ පැස හඳුන්වනුයේ සවැරි-එකුව (Sealed-unit) යන්නෙනි. සවැරි-එකුව පිරිපැස තුළැ සවි කැරැ ඇති. පිටින් බැලුව නොදිස් වේ. පිරිපැසෙහි පසු-කඩෙහි, නලයෙන් තැනුණු දලක් බඳු දෑයෙක් වෙයි. මේ යැ අදිගනුරුව. අදිගනුරුව සිසිල් කළ යුතු යැ. එය සිසිල් කරනුයේ අවටැ ඇති පවන යි. එ බැවින් පිරිසිසිලනයටත් බිත්තියටත් අතරැ ඉඩ-කඩක් වියැ යුතු යැ මනා සේ අදිගනුරුව සිසිල් වන්නට නම්. ඇරිම් වැළිවෙය ද ඇත්තේ පිරිපැස තුළැ සැඟැවී යි. එ බැවින් එය ද නො පෙනේ. පිරිසිසිලනයෙහි දෙර හැරැ බැලුව ඉහළින් පිහිටා ඇති පැසෙක් දිස් වෙයි. එය තුළැ බොහෝ විටැ හිම ද වෙයි. ඉවායුරුව යැ මේ.

පිරිපැස ද එ සේ, මෙ සේ පැසෙක් නො වේ. එහි හැම පැත්තක් මැ සාද ඇත්තේ තහඩු දෙකෙකිනි. තහඩු දෙක මැදූ ඇති ඉඩ-කඩ කෙඳි-කද (Fibre-glass) වන් වෙනුරුම්

(වෙන් + කුරු, වෙනුරු, Insulating)

දෑයෙකින් පුරා ඇති. එ වන් වෙනුරුම් දෑයක් නොවන්නට, පිටනැ ඇති රස්නය පිරිපැස තුළට වැදී එහි තුළැ ඇති සිසිල නැති කරයි. තමනට ඇවැසි පමණට පිරිසිසිලනය සිසිල් කැරැ තැබුමට එහි තුළැ වන් පෙත්ත සුදුසු සේ කරකවා තැබියැ යුතු යැ. මේ පෙත්ත කරකවන විටැ තැප්සිටුව ද ඒ අනුවැ හැඩ ගැස්වෙයි. වරක් තැප්සිටුව හැඩ ගස්වා තුබූ කලැ ඒ හැඩ ගැසුම අනුවැ පිරිසිසිලනයෙහි සිසිල තැප්සිටුව හික්මවයි.

සිංහල භාෂාවට සතුරු වන්නෝ කවරහු ද?–2

(ජයන්ත වීරසේකරයන් විසිනි)

(ගිය කලබ හා බැඳෙයි)

දෙ සතියකට පෙරැ දිනක් නුවර පාරේ බසයෙකැ ගිය දෙ පැවිද්දණ කෙනකුන් අතරැ වූ සංවාදයෙක් මෙහි ලා අප ගේ සිහියට නැඟේ. දඹ දිවැ ජන නායක නේහරුන් ගේ මෙහි පැමිණීම සම්බන්ධයෙන් දෙඩමින් ගිය මෙ දෙ පැවිද්දෝ එක්බිති මෙ රට ප්‍රවෘත්ති පත්‍රය ඔවුන් ගේ සාකච්ඡාවට ලක් කළ හ. මඳ වේලාවෙකින් එක් පැවිද්දණ කෙනෙක් මහත් දෙම්නසින් දෙඩන්නට වන් හ. ඔහු එක් ප්‍රවෘත්ති පත්‍රයෙකැ නම් සඳහන් කොටැ,

"අප කො තරම් වැදගත් ලිපියක් ලියා යැවුව ද ඒ පත්‍රයේ පළ නො වෙයි," යනු කී හ.

"සැබැවට! අපට නම් එ බඳු අමාරුවෙක් නැ," යනුවෙන් ඉතරායාණෝ පැවැසූ හ.

"ලියමන පළ නො වේ නම් යටත් පිරිසෙයින් එයට මඳ විසින් වත් හේතුවක් දක්වීම පත්‍ර සංස්කාරකයන් ගේ යුතු කම වුව ද එ බන්දක් පවා සිදු නො වේ." මෙ ප්‍රථමයාණන් කී සැටි යැ.

දෙ වැන්නාණෝ,

"අපටත් ඔය අමාරුව මුලැ දී නම් තුබුණා. එහෙත් දන් එයින් මිදී සිටිමු," යි කී හ.

"එ සේ නම් මෙහි කිසි යම් රහසක් වියැ යුතු යැ යි සිතන්නට ඉඩ ඇති සේ පෙනේ."

"රහසෙක් නැත්තේ මැ නො වේ. එහෙත් එය තේරුම් ගැනීම ඒ තරම් දුෂ්කර ද යනු මට සැකයෙකි.

"කියන්නැ, කියන්නැ, අපටත් ඕය රහස."

"මේ තරම් තුහුලින් අසන හෙයින් කියමි. එහෙත් මගෙන් දැනැගත් බවක් අඟවන්නට එපා."

"එසේත් කරනවා යැ?"

"පත්‍රයට යැවෙන ලිපියේ යම් කිසි තැනෙකැ – මුල සරියේ නම් වඩා මැනැවි – සංස්කාරකයනට බර ප්‍රශංසාවක් ඇතුළු කරනවා. ඔවුන් සිංහල භාෂාවේ අද්විතීය පණ්ඩිතයා බව, ඔවුන් ගෙන් භාෂාවට සිදු වන මෙහෙය අතිශයින් උදර බව, සිංහල නව කථා ලොකයෙහි අසහාය රජ කම නිතැතින් මැ ඔවුනට හිමි බව යන ආදිය ලිපියට ඇතුළු කළ යුතු යැ. රහස එ පමණ යි."

ප්‍රථමයාණන් මෙ සේ කී කලැ ඉතරයාණෝ කාරණය හොඳින් තේරුම් ගත් බව අඟවා කට කොනෙකින් සිනාහවක් බිහි කළ හ. ඉක්බිති දෙ දෙනා වහන්දැ මැ සින කට පුරා සිනා සී ඔවුන්ගේ සංවාදය අසා සිටියවුනට ද සිනා රසය බෝ කළ හ.

ආත්ම ප්‍රශංසාවට ගිජු වන්නා වූ ප්‍රවෘත්ති පත්‍ර සංස්කාරකවරුන් ගේ සැබැ තතු මෙ බඳු වන හෙයින් ඔවුන් ගෙන් සිංහල භාෂාවට වන වැඩ සිතා-ගැන්ම ඒ තරම් අපහසු නො වේ.

භාෂාවෙ අභිවර්ධනයට රුකුලක් ලැබෙන අයුරින් නිවැරැදි බසින් ලියැවුණු පතක් පොතක් මොවුනට යැවුණ හොත් එය අඳුරට දැමීම එකාන්තයෙන් සිදු වන්නේ යැ. මෙ සේ වනුයේ කවර හෙයින් දැ යි විමැසීමක් කළ කල්හි පත්‍රයේ අනවකාශත්වය එළියට එයි. එහෙත් කිසි ද වැදගැන්මකට නැති පත්

පොත් සඳහා මොවුන් ගේ පත්‍රවලැ තිරු ගණන් යෙදී තිබෙනු නොයෙක් විටැ දක්නා ලැබේ.

පත්‍ර සංස්කාරකත්වය සිය දිවි පැවැත්වීමේ එක මැ මග කැරැගත්තවුන් අතින් භාෂාවට හෝ රටට හෝ සැලැකියැ යුතු සේවයක් වෙති යි සිතීම එක් අතෙකින් දුෂ්කර වුව ද මෙ අතින් පවා ඇතැම් ප්‍රවෘත්ති පත්‍ර සංස්කාරකවරුන් කෙරෙහි දක්නා ලැබෙන දැඩි දීන ගති නිසා නො වේ නම් සිය පිටු කොන්ද ඍජු වැ තබා - ගන්නට අල්ප මාත්‍ර වූ ද ධෛර්‍ය්‍යයක් නැති බව නිසා නො වේ නම්, පත්‍ර සංස්කාරකත්වය මහත් වැඩ දයක බවට පමුණුවා - ගන්නට බැරි මැ නො වේ. එහෙත් නිරන්තරයෙන් මැ සිදු වන බව පෙනෙනුයේ රටටත් බසටත් අවැඩෙක් මැ යි තමන් කුලියට ඉන්නා ගෙයින් පලවා දෝ යන බියෙන් තමන් මවට ගෙ හිමියා නින්ද කරනු හිංසා කරනු බල - බලා ඉවසා සිටින දීනයන් මෙන් මෙ රට ප්‍රවෘත්ති පත්‍ර සංස්කාරකවරු සිය තැන ගැලැවේ දෝ බියෙන් මවු බස නැත කරන්නවුනට රුකුල් මැ දෙති. මොවුන් ගේ දීනත්වයේ තරම සාමාන්‍යයෙන් නොදන්නා හෙයින් රට රවටා - ගැනීමට මොවුනට ඇති වන්නා වූ නිදහස සිංහල භාෂාවට අත්‍යුග්‍ර සතුරු කමක් වැ පවතී.

සිංහල භාෂාවට සතුරු වන්නා වූ ගණයෙහි වැටෙන තව ද පිරිසෙක් නම් ඇතැම් සිංහල ගුරුවරු යැ. මෙ බන්දක් කියා පෑම මහත් සංවෙගයට හේතු වුව ද සත්‍යය හෙයින් නො කියා හළ යුතු නො වේ. සිංහල භාෂාවට පණ දියැ යුත්තෝත් එය රැකියැ යුත්තෝත් සිංහල ගුරුවරු මැ යැ. ඉදින් සිංහල ගුරුවරුන් සැබෑ අදිටනක් කැරැගත හොත් සිංහල භාෂාව නඟා සිටුවීම එක් දෙ හවුරුද්-දෙකින් නිසැකින් මැ කළ හැකි වන්නේ යැ. එ සේ වුවත් ඔවුන් ගෙන් සිය බසට ලැබියැ යුතු ධෛර්‍ය්‍ය වෙනුවට බොහෝ සෙයින් මැ ලැබෙනුයේ මරු පහර මැ යි.' මේ ගුරුවරුන් කෙරෙහි වෙසෙසින් මැ දක්නා ලැබෙන මහත්තම දෝෂය නම් සිංහල භාෂාව නිසි පමණට නො ඉගැනීම යැ. තමන් දත් දැය දියුණු කැරැගත යුතු යැ යන හැඟීම මඳ විසින් හෝ නැති බව ද මොවුන් කෙරෙහි වන්නා වූ තව ද වරදෙකි. වරද නිවරදින් බේරා ගැනීමට අසමත් වන හෙයින් මොවුන් ගෙන් බරතර සතුරු කමක් නම් තමනට ලැබෙන්නා වූ සුළු ලාභයක් පමණක් තකා සවකීය පාඨශාලා වලට පොත් තෝරා - ගැනීම යි. මේ නිසා ශිෂ්‍යයනට පමණක් නො වැ මුළු රටට වන්නා වූ හානිය ඉතා මහති. ගුරුවරුන් ගෙන් සිදුවියැ යුතු අත්‍යුදර සේවය වනාහි සවකීය ශිෂ්‍යයන් තමනට වඩා උසස් උගතුන් කිරීම වුව ද මේ ගුරුවරුන් ගෙන් බොහෝ විටැ මැ සිදු වනුයේ මෙයට ඉඳුරා මැ වෙනස් වූ ලෙස යැ.

අප රටේ ඇතැම් ගත් කරුවන් ද සිංහල භාෂාවේ සතුරු පක්ෂයෙහි ලා ගණින්නට සිදු වීම සිංහලයෙහි මහත් මැ අභාග්‍යය යි. වෙන රටවලැ නම් භාෂාව වැවෙනුයේ අලංකාර වනුයේ, චමත්කාර ජනක වනුයේ, ශක්තිමත් වනුයේ ගත් කරුවන් අතිනි. අප රටෙහි බෙහෙවින් මැ දක්නට ලැබෙනුයේ මෙයට වෙනස් වැ මැ යි. පතක් පොතක් ලියන කලැ එහි යෙදෙන - භාෂාව දැනැ සිටියැ යුතු මැ නො වේ දැ යි නොසිතන්නා ග්‍රන්ථ කරණයට අත්‍යාවශ්‍යයෙන් මැ නුසුදුසු බව නොසැලැකීම මේ රටෙහි මුත් මුළු ලොවැ අන් එක ද රටෙකැ නම් නැත්තේ යැ. අපේ ගත් කරුවන් විකුණාගැනීම මැ පරමාර්ථ කොටැ ගෙනැ යැ ගත් කරනුයේ. භාෂාවේ රමණීයත්වයක් හෝ මතු ඇති වන සිංහල දරුවන් දෙසැ බැලීමක් හෝ ඔවුනට අනවශ්‍ය යැ. නොදත් බැවින් භාෂාව කිලිටි කරන්නවුන් ගෙන් අනුග්‍රහ ලබනු සඳහා සවකීය පත-පොතෙහි භාෂාව කෙලෙසා ලන්නට මේ ගත්කරුවන් ගේ කිසි දු මැළි කමෙක් නැති. තමන් ගේ, නොදත් බව හෙළි වෙති යි බියෙන් මොවුන් අතින් කැරෙන්නා වූ මහා වරදෙක් වෙයි. ඒ නම

සොයා බලා ඉගෙනැ ඒ දෑ අන්‍යයන් ගේ ද වැඩ සඳහා නිර්ලොභ වැ එළියේ ලන උගතුනට අකුල් හෙළීම යැ. මෙ බන්දවුන් අතින් අසරණ සිංහල භාෂාව විඳින්නා වූ ගැහැට මෙ වැනි ලිපියෙකින් කියා නිම කරනු ඉතා මැ බැරි යැ.

ඉංගිරිසි උගතුනැ යි දැපෙන ඇතැම්හු ද සිංහලයට සතුරන් ලෙස සැලැකියැ හැකි තව ද පිරිසෙකි.' ඉංගිරිසිය රජයේ භාෂාව බවට පැමිණී තිබෙන හෙයින් ප්‍රබල වැ නැඟැ සිටුනා බව සැබෑ යැ. එහෙත් ඉංගිරිසියෙහි මේ ප්‍රබලත්වය සිංහලය අසිංහලය බවට හැරැවීමට සමත් වන්නේ නො වේ. අපේ ඉංගිරිසි 'පණ්ඩිතයෝ' මෙ බවක් නො දනිති. එ බැවින් තමන් කෙරෙහි වන්නා වූ ඉංගිරිසි ප්‍රාබල්‍යයට සිංහලය යට කොටැ දැමීමට හැකි තාක් වැර වඩති. මොහු ඉංගිරිසියෙහි රස දනිති, එය උරති, බොති. එයින් මත් ද වෙති. මෙ මත් බවිහි, එක් බර වරදෙක් වෙයි. එ නම් රස ඇත්තේ ඉංගිරිසියෙහි පමණෙකැ යි මේ මත නිසා ඔහු සිතන්නට වෙති; එ බැවින් සිංහලය නීරස යැ යි වරදවා සිතාගෙනැ සිංහල මාළුවට ඉංගිරිසි ලුණු දමන්නට බලති. සිංහල භාෂාවට සතුරු කම් වනුයේ මෙහි දී යැ. එක් අතෙකින් සලකා බලන කල මොවුන් ගේ සතුරු කම අන්‍ය සියලු දෙනා ගේ සතුරු කමට වඩා අනර්ථකර බව පෙනේ. කවර හෙයිනැ? මෙ රට රජයේ සහයොගය බෙහෙවින් ලැබෙනුයේ මොවුනට යැ. රජයේ ඇත්තන් සිංහල නොදැනීම අරුමයක් නො වතුදු ලොවැ ඇති තාක් කරුණු පිළිබඳ වැ උපදෙශ ලැබැ ගත යුත්තේ ඉංගිරිසිය දන්නවුන් ගෙන් පමණෙකැ යි සිතීමේ මහ වරද ගැනැ නම් අපේ රජයේ ඇත්තනට කමාවක් දියැ නො හැකි තරම් යැ. සිංහලයට හත් හෙණ වැදුණ ද රජයේ ඇත්තනට කම් නැති. එහෙත් අපටත් ඒ එසේ මැ වියැ යුතු ද? රජයට උවදෙස් දෙන අපේ ඉංගිරිසි 'පණ්ඩිතයෝ' ඉංගිරිසි පණ්ඩිත කම සකල භාෂා විෂයයෙහි පවත්-වන්නට බලන හෙයින් සිංහල නො දත ද ඒ නොදත් බව නො පිළිගනිති. එ බැවින් දැනීම නොදැනීම කොටැ ද නොදැනීම දැනීම කොටැ ද රජයට සලකවති. එ පමණෙක් නම් ඒ ඉවැසියැ නොහැක්කේ ද නො වේ. මේ ඉංගිරිසි 'පඩුවෝ' සිය මුළාව නුමුළාවක් කොටැ රටට ද පෙන්වන්නට දඟ ලති. අසරණ රජය සමඟ කරන 'සෙල්ලම්' යමක් කමක් දත් රටුන්ට ද පෙන්වන්නට නිර්ලජ්ජ වැ ගිය විටෙකැ දී ඉදින් මේ 'පණ්ඩිතයනට' හොඳ සිහිය ලැබීණි නම් ඔවුනට සිහිය ලබා දුන්නවුන් සමඟ පමණක් නො වැ සිංහල භාෂාව ද සමඟ ආඝාත බඳිති එ තැන් සිටැ සිංහලය මැකෙන තැනට මැ කටයුතු සැලැස්ම ඔවුන්ගේ ජීවිතයෙහි පරමාපෙක්ෂාව කොටැ ගනිති. අසරණ සිංහලය තව තව ද අඳුරට මැ වැටේ.

සිංහලයට සතුරු වන්නවුන් අතරෙහි අපේ ඇතැම් පිරිවෙන් ද ගැනේ මැ යැ. මේ පිරිවෙන් අතරෙහි ද ශාස්ත්‍රීයත්වයට වඩා පක්ෂ ග්‍රාහිත්වය අගේ කොටැ උසස් කොටැ සලකන තැන් මැ අධික යැ. එහෙයින් එක් පිරිවෙනෙකින් කො තරම් ශාස්ත්‍රීය දැයක් එළි වුණ ද අනෙක් පිරිවෙන එයට සතුරු වෙයි. ගහට ලැබෙනුයේ අසරණ සිංහලයට යැ. සිංහලය පාලියටත් සංස්කෘතයටත් යටත් කොටැ තිබීමට යැ මේ පිරිවෙන්වලැ ප්‍රයත්නය වනුයේ. සවශක්තින් සිටීමට සිංහලයට ඉඩෙක් ඇතැයි මේ පිරිවෙන් කරුවෝ නො දනිති. සිංහලයට පමණක් ආවේණික වූ ව්‍යාකරණ රීතියක් හෝ සම්ප්‍රදයයක් හෝ යම් කිසිවකු විසින් හෙළි කැරිණි නම් එය මේ පිරිවෙන් කරුවනට ඉවැසියැ නොහැකි යැ. සිංහලය සවාමි භාවයට පමුණුවා-ලන්නට කැරෙන යම් බඳු ව්‍යායාමයෙක් වේ නම් මේ පිරිවෙන් එයට හැම විට මැ සතුරු වෙති.

සිංහලයට සතුරු වන්නන් ගේ සංඛ්‍යාව ඉතා මහත් බව මෙ සේ අපට ප්‍රත්‍යක්ෂ යැ. එහෙත් සතුරන් ගේ ගණන මැ බලා පසු බසිනු වීරයන් ගේ සිරිත් වියැ යුතු නො වේ. සිංහල ජාතියෙහි මෙ බඳු වීරයෝ නැත්තාහු මැ යැ යි කියැ නොහැකි යැ. ඔවුන් ගේ ගණන ද දිනෙන් දිනැ මැ මහත් වන බව ද නො පෙනෙන්නේ නො වේ. මඳ සැනැ-සීමෙකි.

–සුබස, 1 වෙළුම, 3 කලඹ.
(කුමාරතුංග ගෝමීන් ගේ අවසරයෙනි)

ගැලවීම

අජිත

අනුරාගම අසැ කුඹුක්පොකුණ නම් ගොපලු ගමෙකි. මෙ ගමට එ නම් ලබාදුන් පොකුණ පිහිටියේ ගම් කෙළවර වනාතේ යැ. පොකුණට එ නම ලබා දුන්නේ මහ කුඹුක් ගසෙකි. එය පොකුණෙහි මැ පිහිටියේ, ඇස්වටක් දියට බැසැ සිටුනා මහ යෝදයකු සෙයින් දුරට දිස් වී. ගම් වැස්සනට සොබා දහම දුන් දෑවැද්දක් බඳු වූ මෙ පොකුණ,[1] ගම් වැසි ගොපල්ලනට සිය හරකුන් නැවීම් ඇඟ දෙවීම් ඈ කටයුත්තට අඩු මැ ගණනේ දිනකට එක් විටක් වත් පිහිට වන්නේ වෙයි. එහෙත් ගම් වැසි ගොපලු දරුවනට නම් අඩු මැ ගණනේ දිනකට දෙ වරක් වත් මෙ පොකුණ වෙත නො පැමිණැ මැ බැරි යැ.

එ ද, ගම් වැසි ගොපලු දරුවන් හා දිය කෙළිමින් ඔවුන් හා අමුතු විදියේ හැංගි-මුත්තන් කෙළියෙකැ යෙදෙන සත් හැවිරිදි ගොපලු දරුවකු දෙස මැ ඇස දී උන් අමුත්තෙක් කෙළින් මැ පඬුවස් නුවර බලා ගියේ – පඬුවස් දෙව් රජ මැඳුරට අලුත් මැ සැළයක් ද රැගෙනැ ගියේ – රජ මැඳුරින් තෑගි ද ලබා ගත්තේ යැ.

මේ සැළයෙන්, පඬුවස්දෙව් රජ මැඳුර, විත්‍රාව ගේ මරණයෙන් සත් හවුරුද්දකට පසු යළි එ වැනි මැ වූ කලබගෑනියක් පළ කෙළේ යැ. කලබලය වූයේ පඬුවස්දෙව් රජු ගේ පුතුන් නව දෙනා අතරේ යි. මෙ තෙක් මෙ වැනි කලබලයක් ඇති වූ වනාවෙකැ මැ ඉහියෙන් සිය වැඩිමල් සෝවුරු අබය හව දෙස් නහන ඒ කනිටු සෝවුරු ගණ තිස්ස, මේ වර ද ඒ සිරිත නොමතක නොකෙළේ යැ.

"එ ද විත්‍රාවට මෙ පුතු උපන් ද අපට රජ මැඳුරේ රැඳෙන්නට නො දී අප ද ඇඳ-ගෙනැ දඩ කෙළියේ ගියේ මෙ දෙවු බැයා යි. නියම දඩයම වැරැදුණු නිසා දෝ සාවකු පමණ වත් නො ලැබැ, සුන් සිතින් අප එද්දි වන මැද දී, විත්‍රාව ගේ දූස්ස අපට අහඹුයෙන් හමු වූ විටැ ඈ මළමිනියක් සේ සුදු මැලි වූ සැටි මතක නොවැ? දෙර මඩලායෙහි දූවට ගෙනැ යන ගුඩ පූ යැ යි ඈ හැඳින්වූ ඒ පැස පිරික්සන්නට සැරැසුණු අප එය බිම තැබවූ වහා මැ මෙ දෙටු බැයා "අන්න ඌරෙකැ" යි කියා අප ඒ හිතලු ඌරා පස්සේ යවා පැස තුළැ වූ විත්‍රාව ගේ පුතා - අප පවුලේ මරුවා - ගලවා යැවීමේ විජා මෙ තමා! සෙබළුනි තෙපි වහා ගොස් කුඹුක් පොකුණ වට කැර සිටැ ඒ හොරා ඇතුළු හැම ගොපලු දරුවන් මරවු. එකකුත් යා නො දෙවු. මෙ ද පමෙට වැඩෙ හරියට මැ කරවු."

තිස්ස ගේ මෙ ගිගුරුමට අබය ගේ මුවින් පිළිවදන් විසින් නැඟුණේ "මට මගේ පාඩුයේ ඉන්නට ඇරැ තොපට ඕනෑ මැ එකක් කැරැ ගනිවු." යනු යැ. මෙ සේ කී අබය සිය සොහොවුරනට රිසියෙන්නක් කැරැගන්නට ඉඩ දී එ තැනින් නැඟිටැ ගියේ යැ.

ගෙවුණේ මඳ වේලාවෙකි. අව් ගත් සෙබළ මුළෙක් කුඹුක්පොකුණ බලා නැඟී යනවා පෙනිණි.

ගොපලු දරුවන් කුඹුක් පොකුණේ දිය කෙළියේ යෙදී උන් වේලාව යි ඒ. හැංගි මුත්තමට තමා ගේ වාරය ඒ වූයෙන් සෙසු කොලුවන් හා ගොඩට ඇදුණු පඬු අබා කුමරා "තෙපි හපන්නු නම් මාත් සොයා ගනිවු" යැ යි සෙස්සනට වහසි බැණැ දියට පැනැ පොකුණ මැද්ද කුඹුක වෙත පිහිනා ගියේ, හූවක් කියා දිය යටැ ගියේ යි. ඒ හූ හඬ හා මැ ගොපලු කොලුවෝ පොකුණ සතර වටින් දියට එක වර පිනූ හ. ඒ

1. ජාතිස්සර – මහාවංශය.

එක්ක මැ ජක බක හඬින් පොකුණට පිනූ තවද හැඩි දූඩි පිරිසෙකි. එ නම් පඬුවස් නුවරින් ආ අවි ගත් සෙබළු යි.

සැණෙකින් මුළු පොකුණ එක මැ මර ළතෝනියක් බවට හැරිණි. ළතෝනිය නවතිත් මැ එක් සෙබළෙක් උස් හඬින් මෙ සේ කී.

'මළ කඳන් ගොඩ ගසවු; ගැණැ බලවු; ඒ හා මැ මුන් ගේ ඇඳුම් ද ගැණැ බලවු'.

'සැණෙකින් මළ දරුවන් ගේ සිරුරු පොකුණු ඉවුරේ ගොඩ ගැසෙන්නට වියැ. මේ අතර කිහිප දෙනෙක් ඉවුරේ පළින් පළැ විසිරි තුබූ ගොපලු දරුවන් ගේ රෙදි කඩවල් එකතු කරන්නට වූ. මේ අතරේ බඩ වැටියක් අස්සෙන් එහි ඇදි ආ කෙක්කෙක් රූහැණියක් අයිනේ වූ එක් රෙදි කඩෙකැ ඇමිණි එ ද සෙමෙන් සෙමෙන් බඩවැටිය තුළට මැ ඇදූගත්තේ යි.

මළ සිරුරුත් ගොඩැ වූ රෙදි කැබැලිත් ගැණැ බැලූ එක් සෙබළකු ගණන හරි යැයි කියත් මැ මරුවෝ පඬුවස් නුවර බලා නමාගත් හ.

සියල්ල සන්හුන් පසු කුඹුක් ගස මුළැ දිය සෙලැවෙන බවෙක් පෙනිණි. එ තැනින් මතු වූයේ ළමා හිසෙකි. එ තෙක්, දියෙන්, ඇවිරුණු බෙන සිදුරින් කුඹුක් ගසේ කුහරයට රිංගා, හැංගී, උන් හේ ගොඩට පීනා ආයේ යැ. ඒ පඩු අබා කුමරා යි.

''මරාදමාලා! ඔක්කො මැ මරාදමාලා!'' ඔහුට කියන්නට ලැබුණේ එ පමණෙකි. එ විටැ මැ තමාගේ අත තරයේ ගත්තකු නිසා හේ ගැස්සී සිටියේ යැ; බැලී යැ. හේ අනෙකෙක් නො වේ; සිතිර (චිත්‍ර) නමැති යක් දෙටුවා යැ. ඔහු ගේ අනෙක් අතෙහි කුමරා දියට පනිද්දී ඉවුරෙහි තබා ගිය රෙදි කඩ දක්නට ලැබිණි.

* * * *

'චිත්‍රාවට පුතෙක් උපන්නේ යැ. චිත්‍රයා බැහැරින් සිටැ යෙදූ උපායයට අනුවැ ඒ පුත් බැහැර වියැ. එ ද මැ වැදූ අත් ගැහැනියක ගේ දූවක් චිත්‍රා ගේ ඇඳට පැමිණියා යැ. ''අප සොහොවිරිය දූවක ලද්දී'' යැ යි බැයෝ සොම්නසට පැමිණිය හ. චිත්‍රාව ගේ පුත්‍රයා ද, මව විසින් පළමු මැ තබන ලද පණ්ඩුකාභය යන නම ඇත්තේ, සිය පියා ගේ රැක්ම ද ඇති වැ වැඩුණේ යැ. රහස රාජපුත්‍රයනට හෙළි නුවූයේ නො වේ. ඔහු සිය සොහොවිරියට එ වර කුමක් කළාහු ද යනු නො කියැ හැකි යැ. පණ්ඩුකාභය කුමරු රජ වූ පසු මව දුටු බවක් සඳහන් නොවනුයෙකු හැඟියනුයේ කෙළවර දී ඇයට බැයන් ගෙන් කමාවක් නොලැබුණු බව යි. රජය නම් කිමෙක් ද යනු දැනැගන්නට පෙර මැ කුමාරයා ද පරලොව යවන්නට මයිලෝ තැත් කළ හ. එහෙත් චිත්‍රයා ඔවුන් ගේ ඒ සියලු තැත් පුහු බවට පැමිණැවී යැ.'

— කියවන නුවණ (6)

සුනිල් සාන්තයන් හා හෙළ මියැසිය

-කුමරසිඟි කිත්සිරි

අද හෙළය පුරා මියැසිය (music) පිළිබැඳි මහ ඇල්මක් හා ඉහළ වුවමනාවක් හා ඇති බව් රේදෙවුව, සලරුව (සිනමාව), නළු දසුන ඈ කෙරෙහි විමැසිලි නුවන්, සතන් යොදන පෙනී යෙයි. එහෙත් හෙළයාට මියැසියක් නැතැ යි යන හැඟුමෙන් පිරී-ගත් මේ දුබුල් හෙළයෝ දඹදිවට ගැතිවෙමින් හින්දුස්තානි සගයුව මැ අපට පිහිට යැ යි හිස මුදුනින් පිළිගනිමින් එයින් මැ රසවත් වන්නට රසවත් වී එයින් මැ මත් වන්නට සැදී පැහැදී කල් ගෙවති.

මෙ බඳු හැඟුමකට මේ හෙළබිමේ මුල් මැ හෙය වූයේ විදෙසි පිළිලය හෙළ දූය නැමැති මහ රුකෙහි හට-ගැන්ම යි. ඒ හට-ගැන්ම නිසා දැ ඇල්මෙන් ඈත් වූ මෙ දෙස් වැස්සෝ හෙළයෝ දැ අඳුන් සේ, දඹදිවටත් පැළදිග-ටත් මියැසිය සඳහා වඳින්නට වූවෝ යැ. හෙළ මියැසියක් නැතැ යි . කියමින් ඉහළ පෙළේ ඇත්තෝ පියානාවත් ඉතරයෝ සර-පිනාවත් මියැසිය සඳහා ගන්නා උවහරු විසින් අතට ගත් හ; ඉන් බටහිර-හින්දුස්තානි මියැසියක් නගා-ගත්හ.

රවුළු හෙළ මහ රදණන් සගයුව පිළිබැඳි දැනුමක් ඇති වැ සිටිය හ යි යටගියාවෙ සඳහන් වීමෙන් හා විදැ නම් පල් හොරා හෙළ හැතිරිය වූ කුවන්නාව ගෙන් ලක්ගල් මහල් ගෙදරැ වූ මිහිරි සගයුව පිළිබැඳි වැ විමැසූ බවක් මහවසේ දැක්වීමෙන් හා වුව ද හෙළ සගයුව කො තරම් පැරැණි දූ යි දත හැකි යි.

කවර දත් මේ හෙළදිවට විපත් ගෙනැ දුන් දඹදිවියන් ගේ හා බටහිරි විදෙසින් ගේ හා පැමිණීම නිසා හෙළ සගයුව නැසී වැනැසී යට වී යන තැනට පැමිණි බව නම් ඇත්තෙකි. එහෙත් හෙළ සගයුව නම් කිමැ යි. හඳුනා-ගන්නට, හඳුනා-ගෙනැ ඉන් මැ හෙළ සගයු වක් නිපදවා-ගන්නට මියුරු සදෙසේ පැදිත්, ගැමි ගිත්, වන්නම් රැසත් පිහිට වූ හ යි කිව වරදක් ඇතැ යි නොසිතමි.

හෙළ බසට ඉහළ මැ සේවාවක් කළ ගුරු දෙව් කුමරතුඟු මුනිදස් මහ වියතාණන් කළ හෙළ මියැසිය යන ගත මඳක් කියවත හෙළ සගයුවක් අපට තිබිණි ද යන්න මැනැ වින් වටහා-ගත හැකි යැ. හෙළ මියැසිය පොත් පෙළේ අනෙක් පොත් උන්'තින් බිහි වන තෙක් ඔවුනට දිවමන් වැ මේ දිවේ දිවි ගෙවන්නට රුදුරු මරුවා නපුරු කම් නො කොටැ ඉඩ දිනි නම් හෙළ සගයුවක් අපටත් ඇද්ද යනු ඉහළින් මැ පසක් වනු නියත යි. හෙළයේ පව යැයි කියා සැනැසෙමු. අන් කුමක් කරමු ද?

එහෙත් බසට රැසට දෙසට හිතැති හෙළයා හට සැනැසෙන්නට කෙනෙක් සැදී වැඩි ආ හ. ඔහු නම් සගසු වෙසරද සුනිල් සාන්තයෝ යැ.

> ''ඔළු පිපී-ලා විල ලෙළ දෙනවා සුදට සුදේ
> නංගෝ''
>
> 'බෝවිටියා දං පළුකං වාරේ
> මේ නොවැ පොඩි නංගෝ'

ඈ ගීත් සමඟ මැ මෙ හෙළය පුරා පැතිරී ගිය 'සුනිල් සාන්ත' නම කුඩාවා ගේ සිටැ මහල්ලා තෙක් මැ පුරා වසර ගණනක් හෙළ මියැසි මිහිරෙන් මිහිර කැවූ රඟ පැහැදිලි යැ.

මියැසිය පිළිබැඳි මුල් දැනුම මෙ බිමෙ දී මැ ලබාගත් **සුනිල් සාන්තයෝ** වැඩි දැනුම සඳහා දඹදිවට ගොස් 'හින්දුස්තානි' මියැසිය පිළිබඳ ඉහළ දැනුමක් ලැබීම නිසා **සගයු වෙසරද** යන ඉහළ පටකට හිමිකම් ද අත් කැරැ-ගත්හ. ඔවුන් ගේ හින්දුස්තානි මියැසිය පිළිබැඳි දැනුම් අද හෙළයෙ එ මැ මියැසිය උගත් කිහිප දෙනා ගේ දැනුම් හා සසඳන විටැ ඉහළින් බැබැළෙන බව කිව යුත්තෙක් නො වෙයි. එ බඳු හැකි කම් ඇති වැ වුසු **සුනිල්හු** හින්දුස්තානි මියැසියට යට නො වී ඉන් එළිය ලබා ගෙනැ හෙළ රැස කෙරෙහි සිය හද පත්ලේ වූ ඇල්ම මතු කොටැ-පියා නැසී වැනැසී, වැසී-ගිය හෙළ මියැසිය යළිත් පණවා, ඔප කවා, රස හුවා නිසි තැනට පමුණුවන්නට ඉදිරිපත් වූ හ.

එහෙත් ඒ දුටු 'හින්දුස්තානි මියැසිය' යම්තම් කට ගා-ගත්, හෙළුවැලි ඇඳුම් ලාගත් ඇතැම් කුහුවෝ **සුනිල් සාන්තයන්** ගේ තැත කෙරෙහි හොට උල් කරන්නටවන් හ; සැහැ-වීත් එළියේත් සතුරු කම් කරන්නට වන් හ. එහෙත් **සුනිල්හු** පසු බට නො වූ හ. හෙළ මියැසිය කිමැ යි සොයන්නට වූ හ. **ගුරුදෙව් කුමරතුඟු මුනිදස් මහ වියතාණන්** ගේ 'හෙළ මියැසිය' ගත මුලැ සිටැ අගටත් අග සිටැ මුලටත් කියැවූ හ; සිතූ හ. **කිවිසුරු කවියාණන්**ගේ **මියුරු සඳෙස්** පැදි ගයා වයා මහ පාද ගත් හ. **කුමරතුඟු මුනිදසුන්** ගේ **පුබුදුව**, **හෙළ ගීය** ඈ ගීත්, **රැ. තෙන්නකෝන් කිවිසුරාණන්** ගේ **හැවිල්ල**, **වවුල් තොඹුව** ඈ ගීත් ගැයූ හ. තමත් මැ පැබැඳි ඕළු පිපිලා, බෝවිටියා දං පළුකං වාරේ, හඳපානේ රෑ යාමේ, රැල්ල නැහෙන්නා මඳ මඳ සුළඟින්, අද යි වෙසක් පෝද ඈ ගී ගයා වයා දැක්වූ හ.

දිගු කලක් ඉක්මැ යා නොදී මැ හෙළ හෙළ මියැසිය කිමැ යි තෝරා-ගත් **සුනිල් සාන්තයෝ** හෙළ හවුලේ කරළියෙන් ද ලක් රෙදෙව්වෙන් (Radio) ද ඔවුන් ගේ හෙළ ගී හෙළ මියැසිය හා එක් කොටැ හෙළ ගුවන් තලයේ පමණක් නො වැ විදෙසි ගුවන් තලයේ පවා පැතිරැවූ හ.

සුනිල් සාන්තයන් ගේ මියැසියෙහි වෙසෙසි ගුණ කිහිපයෙක් මතු වැ එන්නට විය. එ හෙයින් එය නියම හෙළ මියැසියක් මැ වූයෙන් ළ-දරුවෝ තුරුණු-තුරුණුවියෝත් සියලු වැඩිහිටියෝත් එහි ලා ඇදී බැඳී පැහැදී ගන්නට වන් හ.

කවර වෙසෙස් ගුණ එහි ඇති වී ද යත්? කැමී සිරිහර රසයෙන් මැ පිරි කබල් බසින් පැබැඳුණු ගීයෙන් හෙළ මිනිසා නොමඟට ඇදී-ගිය සමයයෙකැ සබා රෙසෙන් පිරී-ඉතුරුණු සුසුදු හේළි හෙළ බසින් හෙළ තනුවකට ගැයියැ හැකි ගී ගුරුදෙව් කුමර-තුඟු මුනිදසුන් අතින් පැබැඳී ඇති බව දුටු **සුනිල් සාන්තයෝ** නියම හෙළ මියැසි මඟ එ යැ යි තහවුරු කැරැ-ගත්තෝ එ පෙළෙහි ලා සැලැකියැ හැකි අගනා ගී පැබැඳිය හ.

ඔවුන් පැබැඳි ගී එකක් එකක් ගැනැ විමසා බලත් හොත් කැමී (සිරිහර) රෙසෙන් ඈත් වැ සබා රසයට මැ මුල් තැන දුන් ඒ හැම ගියක් මැ මවක් පියෙක් හෝ වේ වා, පුතෙක් දුවක් හෝ වේ වා, සොහොවිරියක් සොහෝවුරෙක් හෝ වේ වා හවුල් කැරැ-ගෙනැ හිරියක් කිකියක්, විළියක්, බියක් නැති වැ ගයන්නට හැකි යැ. එ මෙන් මැ බස අතිනුදු කො තරම් පිරිසුදු දැ යි එක් එක් පදයක් ගෙනැ විමසත පෙනී යේ. 'නායනා වැනී සුදෝ' වැනි විකාර කළ එක ද පදයක් සුනිලුන් ගේ ගීවලැ ඇත් දැ යි විමසා බැලීම ද කළ යුත්තෙකි. වියරණය නො දෙදරවා අරුත් නිසි විසින් පළ වන සේ පද වැකි ගැළැපූ අයුරු උසස්ම යැ. **ගුරු-දෙව් මුනිදසුන්** ගේ අතින් පැබැඳි **සුනිලුන්** ගේ මුවින් ගැයී හෙළය පුරා පතළ වැ-ගිය **'පුබුදුව'** ගීය වැනි ගී මෙ හෙළයේ මෙ තෙක් බිහි වූයේ වත් බිහි වන්නේ වත් නැති තරම්. දැනට අප අතරැ පවත්නා ළතෝනි ඈ ගීයත් මේ පුබුදුව ගීයත් එක් තැනෙකැ දී ගයවා වෙසෙසියන් ලවා තෝරවත් හොත් 'පුබුදුව' ගීය වැනි ගී හැදෙන වැඩෙන, නැහෙන රැසකට ඇවැසිතම යයි කියනු සැකෙක් නැති.

ඒ ගීයේ අගය තව තවත් හිවී බැබැළී-ගීයේ සුනිල් සාන්තයන් ගේ ඉ-මිහිරි සුනිල් හඬ නිසා මැ යැ. එ මතු ද? නැති. ඔවුන් ගේ මුවින් ගැයී ගුවන් තලයේ රැව් දුන් තව තවත් හිතවතුන් පැබැඳි ගී ද මහත් රැසෙකි. ඒ හැමෙකක් මැ පෙරැ කී ගුණයන් ගෙන් යුතු යැ. එ හෙයින් ඔවුන් ගේ මුව එයට ඉඩ දුන්නා විනා එ ගුණයන් ගෙන් මුතු වී නම් ඔවුන්ගේ මුව ඉඩ නො පවින්නෝ මැ යැ ඔහු.

අහෝ! මෙ බඳු හැකියායෙන් හා පිළි-වෙතින් හා පිරුණු සුනිල් සාන්තයනට - සගයු වෙසරදණනට - හෙළ මියැසි නිපයුවා-ණනට, මේ හේළි හෙළයේ තැනෙක් නැති විණි. උන් ගේ එළිය පෙහෙවියාව දත් ඇතැම් පුහුවෝ කුහුවෝ හිරු අබියෙස කණාමැදිරි යන් සේ වෙති යි බියට පත් වූවෝ කවර කවර මහෙකින් හෝ සුනිල් සාන්තයනට හෙළයේ තිබුණු ඉඩ වසා-ලූ හ. හෙළයේ මහ පව නිසා දෝ මහත් කලකිරුණු බවට පත් සුනිල්හු පසුබා ගිය හ. කුහුවනට පුහුවනට රජයන්නට අවසර පැවා සේ අයින් වැ ගත් හ. වරදෙකි. එ හෙයින් සුනිල් සාන්තයනටත් බසට, රැසට, දෙසට, හිත ඇති හෙළයනටත් බසක් කියනු කැමැත්තෙමි. මේ යැ ඒ.

සුනිල් සාන්තයෙනි, බස, රැස, දෙසට ලැදි කම් නැති කුහු පුහු බලවත් විරුදුවන් දස අතින් නැඟී එද්දි ගුරුදෙව් කුමරතුඟු මුනිදස් මහ වියතාණන් බස පිළිබැඳි ඉහළමැ සේවාව මරු නොඑන තෙක් මැ කළ බව ඔබ දනිති. එ හෙයින් ඔබට එරෙහි වැ දෙරොහු වැ කො තෙක් දෙන අව ද ඉන් පසු බට නො වී හුදෙකලා වැ මැ වුව ද හෙළ මියැසිය පිළිබැඳි උසස් සේවාව නො අඩු වැ කළ මැනැවි.

දෙස බස රැස යන තෙරුවනට හිතැ'ති හෙළයිනි, ඔබ ගේ රටට හෙළ මියැසියක් උසස් සේ නිපදවා - ගන්නට ඔබ රිසි වෙත් නම් සුනිල් සාන්තයන් පෙරමුණට කැඳවා උන් ගෙන් වැඩ ගත මනා මැ යැ. නැත වත්නේ මහත් විපතෙකි. අපට හෙළ සගයු-වෙක් නැති වැ මැ යන්නේ යැ. අහෝ!

* * * *

පුන හැයිය {
මා
මගෙ මා
මගෙ පිය මා
හෙළ බිම නමදිම්
}

1. මගෙ ඇහ නිමැවූ
මගෙ බස හැමැවූ
මගෙ සිත රැමැවූ
මගෙ හිය නැමැවූ

2. ඔබ මිණි දෙරණේ
ඔබ තුරු සෙවණේ
ඔබ සිරි අරණේ
මගෙ දිවි පිහුණේ

3. රැකුමට විකුමට
යසසට ඉසුරට
නො පුදන ඔබහට
මගෙ දිවි කුමකට

— (හෙළ මියැසිය)

පාරිභාෂික පටලැවිල්ල

රජයේ බස සිංහලය වූ ද සිටැ සිංහල සිප් වදන් වෙනුවට කිසි බසකට නැති, කිසි කමකට නැති 'පාරිභාෂික ශබ්ද' යන්නෙක් සිංහලයා පිටැ පැටැවෙන්නේ යි.

'පාරිභාෂායෙන්' වැඩ ගන්නට තැතැනුවෝ අවුලින් අවුලට මැ වැටුණෝ යි. එහෙත් 'පාරිභාෂාව' රකින්නට සමහරු තැත් දූරු හ. උනට නිසි පිළිතුරු සපයන්නට දෝ, රජයේ විදිලි අදිකාරියත්, ලංකා මීගිතෙල් මඩුල්ලත් සුදුසු හෙළ සිප් වදන් තනා වැඩට ගත්හ. ඒ හෙළ සිප් වදන් හැකි පමණින් රටට දෙන්නට ගත් තැනෙකි මේ.

හෙළ සිප් වදන් බොහොවෙකැ අරුත එහි මැ ගැප් වී ඇති. ඉඳුරා නොවැටැහෙන වදනෙක් වේ නම් එළියෙන් විමැසුව මැනැවි.

පහතැ පෙනෙනුයේ එ වැනි එක් වදනෙකැ පහදුවෙකි:–

වා–සකසනය

"Air-conditioner" යන්න හෙළ සිප් වදන්හි "වා-සකසනය" වෙයි. සැකැසීම නම් එක් පන්නයකට හෝ එක් පිළිවෙළ-කට හෝ හැඩගැස්සීම යි. එ සේ සකසන්නේ යම් උවාරණයෙක් ද ඒ "සකසනය" විනා අන් කිමෙක් ද? එ බැවින් වායුව සකස් කරන උවාරණය 'වා-සකසනය' ලෙස හැඳින්වීම සුදුසුතර යැ.

හැයි, "වායු සමීකරණය" යනු නුසුදුසු ද? සුදුසු යැ. එහෙත් එය වායුව සම කරන උවාරණයකට වියැ යුතු. 'Air-conditioner' යන උවාරණයෙන් වායුව සමැ නො කැරෙයි. ඉන් කැරෙනුයේ, වායුවෙහි රස්නය, දියදූරියාව (humidity) යන දැ එක් සුදුසු පන්නයකට සකස් කැරුම යි. කුමකට කුමක් කීවත් සරි යැ යි සලකන්නෝ ද වෙත් මැ යි. දෙල් ගෙඩියට පොල් ගෙඩිය යැ යි කියූ විටැ පොල්-තෙල් හිඳිමට ගිය තැනැ දි වරදින වග නොතැකීම යැ මඳ අඩුව-කට ඇත්තේ!

—සකසු]

(ගිය කලඹ හා බැඳෙයි)

Identify සුහඳුනයි
Ignite අවුළයි
Ignition ඇවිළුව
Ignition switch ඇවිළුම් වහරුව
Ignitable ඇවිළුම්සුලු
Illuminate උදුළවයි
Illumination උදිළුම
Image පිළිබිඹුව
Immersion heater කිඳැවි රත්කුරුව
Impede ගහටයි
Impedance ගැහැටිය
Incandescence තැවිදිළුම (තැවි + දිළුම)
Incandescent lamp තැවිදිළි පහන
Incinerate පිරිදවයි
Incinerator පිරිදවනය
Indent දැණවයි (දැ + අණවයි)
Indent (n) දැණවිය
Indenting දැණවුම
Indicate හඟවයි
Indication හැඟැවුම
Indicator හඟවව
Indicator, Bell සීනු හඟවව
Indicator, Call ඇමැතුම් හඟවව
Indicator flag හඟවු කෙහෙළිය
Indicator lamp හඟවු පහන
Indoor ගෙතුළ

Indoor aerial ගෙතුළැ ඇහැසිය
Induce අනුදනවයි
Inductance අනුදනැවියාව
Induction අනුදනැවිය
Inductor අනුදනවුව
Industrial කැමි
Inflame ඉදල්වයි
Inflammable ඉදල්විසුලු
Inquire විමසයි
Inquiry විමැසුම
Inquiry, Disciplinary විනයනු විමැසුම
Inset තුළැසිටු
Inspect පිරික්සයි
Inspection පිරික්සුම
Inspection lamp පිරික්සු පහන
Inspection report පිරික්සුම සැළය
Inspector පිරික්සු
Instal පිහිටවයි
Installation පිහිටැවුම
Insulate වෙනුරයි (වෙන් + කුරැ)
Insulation වෙනුරැම
Insulation, Double දෙ-වෙනුරැම
Insulation resistance වෙනුරැම් රොද
Insulation tape වෙනුරැම් පටි
Insulator වෙනුරැව
Intake තුළැගනි
Intake tower තුළැගැනුම් අටල්ල
Inter-electrode capacity තුරැ විදුදොරැ පෙහෙවියාව
Inter-communication අතුරැ-සැළකුරැව
Inter-connect අතුරවුණයි (අතුරැ + අවුණයි)
Inter-connection අතුරැවිණිය
Inter-connector අතුරවුණුව
Inter lock අතුරගුල (අතුරැ + අගුල)
Intermediate අතුරැමැදි
Intermediate frequency (*I.F*) අතුරැමැදි නිතැරියාව (අ.නි.)
Interrupt අතුරැසිඳි
Interruption අතුරැසිඳුම
Interview අතුරැදක්ම
Interview(*v*) අතුරැදකී
Invert අවවටයි
Inversion අවවැටුම
Investigate සවික්සයි (ස + ඉක්සයි)
Investigation සවික්සුම
Investigation, Preliminary පෙරයුරැ සවික්සුම
Investigator සවික්සු
Ion විදුණුව (විදු + අනුව)
Ionisation විදුණුරැවම
Ionise විදුණුරයි
Iron core යා-හර
Iron cored යා-හරලු
Iron ore යපස්
Isolator වෙන්කුරැව
Isolator, Load breaking බැර සිඳිනා වෙන්කුරැව
Isolator, Load making බැර සාදනා වෙන් කුරැව
Isolator, On-load බැර-පිට වෙන්කුරැව
Isotherm සමතැපිය
Isothermal සමතැපැති
Job කම'කිස
Job card කිස පත
Join පුරැද්දයි
Joint පිරිදිය
Joint, End අක් පිරිදිය
Joint, Tee ටිකිළි පිරිදිය
Jumper පිනුව
Junction සන්දිය
Junction box සන්දි කැටය
Jut නෙරයි
Jack ඔවඩය (ඔ + අඩය)
Jack sleeve ඔවඩ සිවිය
Jack tip ඔවඩ තුඩ

එළුව

රෑ. තෙන්නකෝන්

එළුව වනාහි තෙ වළා දහමට සපුරා අටුවා සැපැයීමට ද පමණ වූ, බුත්සරණ, අමාවතුර, කව්සිළුමිණ කුසද කව ආදි අගනා උසස් පබඳ කිරීමට ද සුදුසු වූ, කවර අරුතක් වුව ද සිතට කා වදනා සේ ඉතා කොටින් පළ කිරීමෙහි සමත් වූ, ගැටලුයෙන් තොර වූ, වදන් ඉතා සුළු ගණනෙකින් කාරිය සිදුවන පමණට පිඩු වූ, කැටි වූ, සැකෙව් වියරණ විදි ඇත්තා වූ, සුමිහිරි බසෙකි. කවර බසෙකැ වදනක් වුව ද වැද්ද-ගෙනැ එය සිය සරුපයට හරවා-ගැන්මේ හැකියාවක් එයට ඇත්තේ යි. බිළිදකු වුව ද 'ගී-සීපද' කවියකු බවට පමුණුවා-ලන පමණට මත් අනුරු වූ වදන් වහරක් ඇති මෙ වන් බසකට ඉතා සැකෙවින් හෝ කරන ලද වියරණ පොතක් දෙකක් නුවූ හ යි සිතිම ද සුදුසු නො වේ. එහෙත් එ වන් පොතක් වූ හ යි කියා-පැ එය ඔප්පු කිරිම ද එ තරම් පහසු නො වේ. 'දය් මාළේ, ද පුද යි මාළේ, ඉන් සේ, ඉන් සේ,' ආදී නය් වහරින් ආ වදන් පිළිබඳ වැ නිපැයුම් දක්වන මහ උවසු ගුරුළුගෝමි ඈ ඇදුරන් හෙළු වියරණය නො හදළ හ යි, කාට කියැ හැකි ද? එහෙත් ඔවුන් ඇසුරු කළ ඒ වියරණ පොත් ලකුණකුදු නො තබා අතුරුදහන් වූයේ ද? එ සේ නැති නම් ඌ තුමූ හෙළු වියරණය පතක් පොතක් ඇසුරු නො කොටැ ගුරු මියෙන් මැ උගත්තෝ ද?

බුදුගොස් හිමියන් තෙ වළා බණට අටුවා සැපැයුයේ හෙළ අටුවා මගද බසට නැඟීමෙන් බව ලොවේ පළ කරුණෙකි. මුළු තෙ වළා බණට හෙළ බසින් සැපැයුණු අටුවා පැවැති බවට කිසි දු සැකෙක් නැති. එ හෙයින් අද තෙ වළා බණට ඇති අටුවා සියල්ල මුලින් හෙළ අටුවා බව කියැ යුතු නො වේ. හෙළ බසින් වූ පස් මහ අටුවාවක් ගැනැ අපට අසන්නට ලැබේ. දහම් පියා අටුවාවට කළ සන්නයේ නො එක් තැනැ එ අටුවා සඳහන් වෙයි. ''විසුද්ධි මග්ග'' සන්නයේ නො එක් තැනැ ඒ අටුවා පොත්හි වූ වැකි කඩ ද දක්වෙයි. එ හෙයින් එ අටුවා වූ බවට කවර නම් සැකෙක් ද? එහෙත් අද ඒ අටුවාවන් ගේ එක් පත් ඉරුවකුදු දක්නට නැති. ආදියෙහි හෙළ බසින් කරන ලද 'කෙහෙද වසක්' පැවැති බව අපි දනුමූ. එ සෙයින් මැ 'සැ වසක්' පැවැති බවට දූන් ඇති 'ථූපවංසය' මැ දෙස් කියයි. 'මහ බෝ වසක්' පැවැති බව 'මහා බොධි වංශය' කියයි. 'දළද වසක්' වූ බව 'දඨාවංසයෙන්' මැ එළි වෙයි. වේදේහ හිමියන් රසවාහිනි නම් පබඳ කෙළේ පෙර හෙළ බසින් වූ පබඳක් ඇසිරින් රට්ඨපාල හිමියන් විසින් කරන ලද අනෙක් පබඳක් පෙරළා සකස් කිරීමෙනි. අක් බෝ රජු අවධියේ දෙළොස් මහ කිවි කෙනකුන් පොත් කළ බව සඳහන් වේයි. එහෙත් අද දවසේ ඒ පැරණි හෙළු පොත් එකක් ද දක්නට නැති. මේ සිදත් සඟරායෙහි දක්වා ඇති නිදසුන් සැපැයූ පොත් අතුරින් 'කව් සිළුමිණ කුසදවත්, මුවදෙව්දවත් හැර සෙසු එකකුත් අද දක්නට නැති.

ඉතින් මෙ පොත් සියල්ල අද දක්නට ලකුණකුදු නො තිබා අතුරුදහන් වූයේ කෙසේ ද? මේ දිවෙ මහ වෙහෙරේත් උතුරු වෙහෙරේත් පැවිද්දන් බණ දහම් හටන්හි යෙදී සිටි අවදියේ ඔවුන් නතු වූ අපේ රජුන් වරින් වර මෙහි වූ පත පොත ගිනි බත් කැරුවූ බව ඇත්ත යි. එ පත පොත ගිනි ලැවීමේ දී එය අයත් වූයේ උතුරු වෙහෙරට ද මහ වෙහෙරට ද යන්න බැලුවා 'මීසැ එය එළු පොතෙක් ද මගද පොතෙක් ද? යන්න බැලුවේ නැති. එ හෙයින් එ පොත් පත් ආදහනය කවර බසින් වූ පොතටත් පොදු වුණා මීසැ හෙළු පොතට මැ වනසට සිටි එකක් වූයේ නැති. පොලොන්නරු

අවදිය අවසාන කරමින් මෙහි බට 'මාඝ' රජු කැටි වැ පැමිණි දෙමළුන් පත පොත වනසමින් මහ පුස්කොළ පොත් බැඳුමෙන් මුදු කුඩා ළමයින් පොල්පිති හරකුන් ඇද-ගෙනැ යන්නා සේ මහ මං ඔස්සේ – පත් ඉරු සියල්ල ඉනී වැටී අවසන් නො වන තුරු – ඇදැ-ගෙනැ ගිය බව සඳහන් වෙයි. එහෙත් ඒ පිණිසැ දෙමළුන් එළුවත් මගදයත් තැකූ හ යි අපි නො සිතමු. මාඝ විපත එළු මගද දෙකට මැ පොදුයේ පැමුණුණා මිසැ එළුව මැ බලා පැමුණුණේ නැති. සීතාවක නුවර වාසලේ රාජසිංහ නම් පණික්කි රජ 'ශිව ලිංග' වැඳැ පුදන ආඬියන් නතු වී තල් ගස් උසට කඳු ගස්වා පත පොත දැවූ හ යි අයෙක් කියති. එහෙත් ඒ රජු ඒ වැන්නක් කළ බව ඇදැහීමට එක් කරුණකුත් පෙනෙන්-නට නැති. හොඳ යි අපි ඒ ද වූ සේ සලකමු. ඉතින් ඒ පොත් ගිනි මැල ගැසීමට එළු පොත් මැ වෙසෙසින් මැ කඳු ගැස්සීමෙහි ඒ රජු හෝ ඒ පෙරෙවි 'ආඬි දනන්' හෝ යුහුසුලු වූ බවෙක් නො පෙනේ නම් එහි දී ද විපත එළු මගද දෙ වගේ මැ පතට පොතට පොදුයේ මැ යි පමුණුණා නම් පැමිණෙන්නට ඇත්තේ. ඒ හෙයින් ඒ පොත් දවාලීම්, පොත් සිඳැ බිඳැ විසුරුවාලීම් ආදි විපතින් මෙ දිවේ වූ එළු පොත් මැ නැසෙන්නටත් මගද පොත නො නැසී රැකෙන්නටත් හේතු නැති හෙයිනි.

එළු පොත් නැසී යාමට කවර කවර කරුණු ඇති වුවත් ඉන් මුල් මැ කරුණ වූයේ ඒවා නො තකා හැරීම යි. එළුවෙන් ගෙයි දෙරේ, වත්තේ, පිටියේ කතාව මිසැ අන් කිසි වැඩක් නො ගන්නා තැනට කරුණු යෙදුණු පසු එළු පත පොත පිටපත් කොටැ ගන්නෝ නැති වූ හ. එළුව කට වහරින් හුරු කොටැ-ගන්නක් මිසැ පතෙකින් පොතෙකින් ඉගෙනැ දත යුත්තෙක් නො වී. එයින් එළු පොත් කෙමෙන් කෙමෙන් අතුරුදහන් වන්නට පටන් ගැනිණි. පෙළ අටුවා මගදයට නැගූ පසු, 'බුදු බණ නම් මගද බණ යැ' යි සිතූ මිනිස්සු බණ දහම මගදයෙන් මැ හදරන්නට වූ හ. බුදු රදුන් බණ වදළ, කතා බස මගදය යැ යි හැඟීමක් මෙ රටේ මිනිසුන් ගේ සිත් තුළැ ඇති වීම නිසා ආගම දහම පිළිබඳ සියලු කටයුතු මගද බසින් කරන්නට දනෝ නැමුණෝ යි. මගද වදන බුදු වදන හැටියට සලකන්නට වූ දනෝ මගදයෙන් පැවැසුණු කවරක් වුව ද බුදු බණැ යි ගත් හ. අනෙකක් තබා මල් පහන් පිදීම, සිල් ඉල්ලීම, සිල් ලැබීම, දන් පිළි-ගැන්වීම, මළ ගියවුනට පින් පැමිණැවීම ආදී සියල්ල මැ මගදයෙන් කරන්නට උගු පුරුදු වූ හ. මේ රටේ මිනිස්සු බුදු බණ නම් මගද බසින් දෙසන දැය යි, හෙළුයෙන් පැවැ-සෙන්නේ නිසරු දැයෙකි, ඒ නුගත් නැණ මද දනන් සඳහා පැවසෙන්නෙකැ' යන හැඟීම අදහන්නට වූ හ. ඒ ඇදැහීම මෙ මැතැ දී ද පැවැති බව,

'ඒ බැ වි න් එළුයෙන් කිව යි　　අනාදර
නොවමින් අදරින් බැතියෙන් නම කර
සතොසින් ඇසුවොත් මෙ දහම් මනහර
සැ බැ වි න් සිදු වෙයි සග මොක් සිරිසර'

යැ යි පැවිද්දන් ගේ මැ පැවැසුමෙන් පෙනේ.

(ලෝ වැඩ සඟරාව)

නකත් සතර, දහම් සතර, වෙද සතර ආදී සියල්ල සඳහා රුසියන් ගේ බස වූ සකුව හැදෑරීම ද මෙහි පළ වූයේ යි. හොඳ සමත් නැකැත්තා සකුව දනැ ඉන් ඒ හදළේ යි. දහම් සතර නො සිඳැ අදිකරණය පසිඳීමෙහි සමත් වූයේ, යුතු අයුතු කම් දත්තේ සකුව ඇසුරු කරන්නේ යි, හොඳ වෙද ඇදුරා නම් වෙද රුසියන් ගේ බස වන සකුව දත්තේ යි. නැණ ඇත්තෝ, නම් එළුව නො දත්, දඹදිවේ බස් දත්තෝ මැ වූ. ඒ හැඟීම අදත් අප කෙරේ පවත්නේ යි.

'ප හ ළ　පොරණ ඉසිවර මුවෙනි මනනඳ
දෙමළ　සකු මගද නො හසළ සතට දද
පු ව ළ　නිති සත ගත පද අරුත්　ලෙද
සි හ ළ　බසින් සැකෙවින් කියමි පද බැඳ'

යැ යි අලගිය වන්න මුකවැටි තෙමේ ද ඒ හැඟීම පළ කෙළේ යි. මෙ අද වුව ද සිය බස දැන්ම නුගත් බවට ලකුණක් හැටියටත් පර බස දැන්ම, 'සකලශාස්ත්‍රපාරාවාරපාර-දර්ශී' බවට හනක් හැටියටත් තමා සැලැ-කෙන්නේ. මගදය උගත්තේ සකුව උගත්තේ, ඉංගිරිසිය උගත්තේ, එළුව ''සවයම්භූ ඥානයෙන් ගෙවා දත්තේ'' යි

යන හැඟීම ඒ ඒ අවදියේ දී අපේ රටේ මිනිසුන් ගේ සිතෙහි - පොලෙහි තෙල මෙන් - රැඳී පැවැත්තේ යි. මේ දූන් වුව ද දිවයිනේ පඬු දනන් සිතන්නේ ඉංගිරිසිය 'සර්වඥ' බවට කැටපතක් හැටියට යි.

එළුව පන්සලට වැද්ද නො ගන්නා ලදී, පිරිවෙනට නො වැද්ද දෙන ලදී, වෙද ගෙදර ඇසුර නො ලද්දේ යි, නකත් රාල දක්නට ඉඩ නො ලද්දේ යි, පඬු දනන් කෙරේ තැනක් නො ලද්දේ යි, නුවර දක්නට දෙර අවසර නො ලද්දේ යි. පිටිසර මිනිහා ගේ ගෙයි, ගොවියා ගේ පැලේ යදියා ගේ මුව විටේ රැඳී ඔවුන් ගේ එදිනෙද කටයුත්තේ, හවුල් වූ එළුව මේ රටේ පැවැත්තේ පිටිසර දිළිඳු දනන් ගේ පවතිනි. එ හැටි එළුයෙන් වූ පැරැණි පොත පත කවුරු කුමට පිට පත් කොටැ-ගනිමින් රකිත් ද, බෝ කෙරෙත් ද? සකු මගද පත පොත මැ පිට පත් කොටැ ගනිමින් බෝ කිරීම, එළුයෙන් වූ පත පොත මගදයට නඟමින් ඉදිරි පත් කොටැ කොටැ එළු පත පොත මුලු ගැන්නීම, ආදි කරුණු නිසා ආදියෙහි වූ හෙළ අටුවා ඇතුළු එළු පොත් නටබුන් වෙහෙර දගප් සෙයින් නැසී ගියේ යි, යම්තමින් වත් එළුව හදරන්නට සිතුවනට එළු වියරණය සකුවෙන් හෝ මගදයෙන් හෝ සපයන ලද්දේ යි, එළු කව් ලකර විරිත් ආදිය සකුයෙන් මගදයෙන් සපයන ලද්දේ යි. එ කරුණ නසා එළුව සකු මගද දෙමාපියන් ගෙන් ද වූ, වැඩකට නැති, දස් පෙලේ දරුවකු කොටැ පඬුවෝ සැලැකූ හ. අනුබුදු බුදුගොස් හිමියන් ගේ අටුවා ඇති විටැ ඔවුනට කවර නම් හෙළ අටුවා ද? සකු කවියන් ගේ පස් මහ කව (රඝුවංශය), කුමාරසම්භවය ශිශුපාලවධය, කිරාතාර්ජුණීය, භට්ටි කාව්‍යය) ජාණකීහරණය ආදියත් දඨාවංශය, ජිනාලංකාරය ආදී මගද කව් පොතුත් ඇති විටැ කවර නම් එළු කව් පොත් ද? සකු ඇදුරන් ගේ අට වියරණය, මගද වූ මුගලන්, කසයින් ආදී වියරණ ඇති කලැ එළුවට කුමට ද තවත් වියරණ? දඹදිවෙ ඇදුරන් ගේ කව් ලකර පොත් ඇති විටැ කුමන ලකරෙක් ද එළුවට?

එ විටැ එළුයේ සියලු අඩු පාඩු කම් පිරිමසා-ගැන්මට මගදයෙන්, සකුයෙන්, පිහිට සොයන්නට වූ ඇදුරෝ "එළුව එ දෙබස ඇසිරින් නිපන් එකෙකැ" යන හැඟීම අපට උරුම කළ හ. මේ සිදත් සහරාව පවා අඩු තැන් පුරවා කටු මැටි වසා සුනුවම් කොටැ බැබැළැවීමට ඇවැසි දය ගත් නිදහන් බිම් දක්වන ඇදුරෝ මහ දිග පොත් නම වැළක් දක්වති. පුදුමය නම් මේ වැළට, 'තෝල් කැප්පියම්' නම් දෙමළ පොතත් ඇතුළු නොවීම යි. 'මෙ කුදු සිදතැ' යි සිදත් සහරා කරුවාණන් විසින් මැ සඳහන් කරනු ලැබෙන මේ එළු වියරණ පොත නොයෙක් මලින්-රොන් ගෙනැ පැණි පුරා ලූ මී වදයක් බඳු අරුම පුදුම එකෙකි. නිකම් මැ මේ විසිතුරු අසන අයට එක් වට මැ පෙනෙන්නේ මේ එළු වියරණය සකු මග ද පොත් වෙනෙන් නය රොන් ගෙනැ බැඳි වියරණ මී වදයක් මෙනි. එ සකු මගද පොත් නොහසළ දද යතට මිසැ එ පොත් ඇසුරු කළ මහ පඬුවනට එළුව දන්නට කුමට ද තවත් එළු වියරණ? ඔන්න ඔයෙ හැඟීම නිසා යි, ඒ ඒ වියරණ පොත් පෙරැ පැවැතුණා නම් එ පැවැති ඒවා නැති වී ගියේ. එහෙත් අන් වියරණ නයක් තබා 'ණ, න, ළ, ල' යන සතරකුර පමණක් වත් සලකා බැලුව හොත් මුළු මහත් දඹ දිවෙ ඇති තාක් සකු වියරණ පොතුත් ලොවේ ඇති තාක් මගද වියරණ පොතුත් හදරා හෝ එහි යෙදුම් පහදන්නට බැරි බව කවර පඬුවකුට වුව ද පෙනී යනවා ඇති.

එළුව, මගදය හෝ සකුව හෝ මෙන් පොතට ඇරුණු බසක් නො වැ මිනිසුන් කතා කළ බසෙකි. එ හෙයින් එහි ඇත්තේ මගදයේත් සකුවේත් මෙන් මහ දනා හට සතර වාසල වැසූ වළවු සබාව නො වැ ඇම දිගින් ගලා එන ඇළ දොළ දියට වැදීමට සරසක් හැති මහ නදියෙකැ සබාව යි. කවර බසෙකින් වුව ද, කවර පසෙකින් වුව ද අවුත් වදනා වදනකට එළුයෙහි ඉඩ කඩ ඇත්තේ යි. නිති නට වහරේ පවත්නා බසක් හෙයින් එහි වදන් වේ වා වැනි වේ වා දිගින් දිගට වූ වහරින් සකස් වී, කැටි වී, සැකෙවී වී ඇත්තේ යි. සැකෙවී බව එළුයේ වෙසෙස් ලකුණ යි.

(—සිදත් සහරා පෙර-වදනිනි.)

දූහුන පබඳ

I

මුහුදු වෙරළ

මෝහන් අබේනායක

අව්ව හොඳට තියෙන දට
පාවෙන සුදු වලා වාගෙ
පෙරළි-පෙරළි රළ එන්නේ
වෙරළ දිහා බලාගෙන යි.

සිප්පි කටු යි, ඉකිරි කටු යි
ලස්සන සුදු පාට ගලුයි
දූලි පොකු-හක් ගෙඩි-කවඩි යි
ඇහිඳින්නට හොඳ ම තැන යි.

හුභාරයක් ඇතිත් යන
උසට උසේ රුවල් දිළෙන
අර පාවෙන මහ ඔරුවෙක්
කව ටිකෙකින් වෙරළට එයි.

කෝම් පිට්ටු තම්බන්නට
පොඩි රළ ගෙඩි පාගන්නට
සරුංගලේ උඩ යවනට
වෙරළ අගෙයි කුඩා අපට

හැන්ද වට පාට වැටෙන
ආකාසේ බලන පිණිස
කුඩා ළමුන් දිව-එන්නේ
වෙරළ බලා ගෙන යි හවස

(ස-වැනි ගොල්ල)

II

කතරගම ගමන

කාලිංග විජයවර්ධන

පොසොන් පෝයට පසු ද අප කතරගම ගියා. අප ගියේ මෝටර රියෙනි. රිය පැදෙව්වේ අපේ ජයසිංහ මාමා යි. ඒ වැඩේට හේ හරි හපනා. අපේ තාත්තාත් අපේ පාසලේ ගුරුවරුන් තුන් දෙනකුත් අප සමඟ ගියා.

මඟ දී අප පොසොන් තොරණ රැසක් ද පෙරහරවල් දෙකක් ද දැක්කා. කළුතර දී දුටු පෙරහරේ යම රජ්ජුරුවන් ද ගියා. අප්පේ, ඔහු ගේ නපුරු කම! තංගල්ලේ පෙරහරේ ගිය මහ බඹා ගේ උස! පැළ ගස්වල පොල් අතින් කඩන්නත් පුළුවනි ඔහුට!

රෑ වුණ නිසා අප හම්බන්තොට නිදා-ගත්තා. නින්දෙන් ම මට ගොරවන සද්ද-යක් ඇසී ඇහැ ඇරුණා. බැලින්නම් ඒ ජයසිංහ මාමා.

පසු ද උදේ අප ආයෙත් පිටත් වුණා. කතරගම ළං වන විට අප බැති ගී ගයන්න පටන් ගත්තා.

කතරගම දී අප මැණික් ගඟේ නැවා. ජයසිංහ මාමා නෑමට වැඩිය වටපිට බැලීම යි කෙළේ. නා ඉවර වී අප කිරි වෙහෙර වැඳීමට ගියා. පින් රැස් කැරගත්තා. ඊළඟට කතරගම දෙවොලට අවුත් ඒ පින් දෙවියනට දුන්නා. පුද පූජා පිරිනැමුවා. බාර ඔප්පු කළා. එ ද රෑ අප කතරගම නැවැතුණා.

පසු ද උදේ පූජාවටත් හවුල් වී කතරගමින් පිටත් වුණා. ජයසිංහ මාමා අප කැටුව කෙළින් ම ගියේ රිදියගම අමුණ බලන්න යි. වලවේ ගඟ හරහා බැඳපු ඒ, මහ විසාල වැඩෙකි. ජයසිංහ මාමා මහත් ආඩම්බර-යෙන් ඒ දිහා බලා උන්නා. මේ අමුණ බැන්දුවේ ජයසිංහ මාමා ලු.

එ තැනින් පිටත් වුණු අප දවල් කෑමට මාතර ආවා. ආයෙත් පිටත් වුණා. උණ-වටුන හරියේ දී රිය නිකම් ම වාගේ නැවැතුණා: 'අන්න ඒ ගෙදර?' කියා කීවා. අප කවුරුනුත් එහි යැවුණා. ඒ නැන්ද හරි හොඳ යි. මට කිරි තේ පෙවවා. අපේ තාත්තා අප එක්ක ආ ගුරුතුමා ගේ නම කියා ඔය ඒ නැන්ද තමයි කීවා. නැන්ද හිනා සුණා. තව ම ඒ තරම් දුර ගියේ නැතැ යි කීවා. කවුරුනුත් සිනා සුණා.

එයට පස්සේ අප ගාල්ලට ආවා. සවස කොටු කාප්පය උඩ ඇවිද්ද. ඊළඟට කෙළින් ම ආයේ ගෙදර යි.

(සිව් වැනි ගොල්ල)

III

මදුරුවා කොඳුරයි

බාතිය සිරිවර්ධන

මිනිසා ගේ ඇඟ ලේ ගඟෙකි. එහෙත් ඉන් මා ඉල්ලන්නේ කො තරම් ටික ද? ඒත් නිකම් ම නො වේ. පොඩි සින්දුවක් කියා පිනවා එයට කුළිය හැටියට යි ඉල්ලන්නේ. ඒ වුණාට මට ලැබෙන්නේ අතුල් පහරෙකි!

ලේ දන් දෙන්නට ලේ බැංකුවලටත් මොවුන් යනවා. ඇස් දන් දෙන්නත් ඕනෑ ම වේලාවක සූදනම් ලු! මෙහි හොරය කිමෙක් ද? අපට ලේ පොදක් දන් දුන්නාට පත්තරවල නම පළ වන්නේ නැහැ නොවැ?

එක් අතෙකින් වැඩි මහලු අප, අතින් පයින් තළා මැරුවත් කමෙක් නැහැ. අපේ කුඩාවුන් කරන වරද කිමෙක්ද? ඒ අපේ පැටියන් වසන දිය කාණු, දිය කඩිති පවා බෙහෙත් දියරක් ඉස වනසනවා. පොඩිවුන් හට තිරිසන් සතුන් පවා දක්වන ආදරේ මේ හැදුණා ය කියන මිනිසුන්ගේ සිතේ නැති හැටි!

තවත් කරුණෙකි. අසරණයන් ගේ හුස්ම තද කොට මැරිම තරම් දරුණු වරදක් කළ හැකි ද? මොවුන් ඒකත් කරනවා. මුන් වසන තැනෙක අප ගැවසෙනවා නම් මුන් කරන්නේ දුම් ගැස්සීම යි. දුම් වුණත් ගැස්-සිය යුත්තේ එහෙම නො වේ. හුස්ම ගැනීමට අපාසු නොවන පමණට විය යුතු යි. මා හිතන්නේ මේ මිනිස් සතුන් හුස්ම ගන්නේ නැති ජාතියෙකැ කියා යි. අනුන් ගේ අමාරුව නොතේරෙන්නේ ඒක යි.

දැල් දැමීම කොයි අතින් බැලුවත් පිනක් නොවන බව කිය යුතු ය. ඉතුත් දරුණු ම පව නම් මදුරු දැල් දැමීම යි. මේ දැල්වල පැටැලී දිනකට අපේ කී දෙනකු පරලොව යනවා ද? මුනුත් පරලොව යන දට තමා අපට කරන මේ විපත්වල විපාක විඳින්නට වන්නේ. මේ නිසා ම මදුරු නරකය කියා අමුතු ම නිරයක් මිනිසා වෙනුවෙන් නො මැවුණොත් පුදුම යි!

(සත්වැනි ගොල්ල)

IV

මට වුණු ඇබැද්දිය

ගැමුණු පුරනදු

මම ගල්කිස්සේ සාන්ත තොමොණු විදු හලේ සිසුවෙක්මි. මා එන්නේ අපේ ම මෝටර රියෙනි; වැල්ල වත්තේ සිට යි. එ ද අපේ රිය අලුත් වැඩියාවක් නිසා මට බසයෙන් පාසල් එන්නට සිදු විය.

අම්මා මට පැසිනි මිල හැටියට එ ද දුන්නේ සත හැට යි. සත පණහ මගේ දවල් බොජුනට යි; සත දහය මඟ වියදමට යි.

එ ද හවස පාසලින් පසුත් පැයක් පමණ රැඳෙන්නට මට සිදු වුණා. මා මඟ පාරට

ගියේ හතරට පමණ යි. එ විට ම බසයක් අවුත් නතර කළා නැවැතුම් පළේ. ගෙදර යෑමට ඉක්මන් වී සිටි මම දිවගෙන ගොස් පිටත් වෙද්දී ම වාගේ බසයේ එල්ලුණෙමි. වැල්ලවත්තට ටිකිත්තක් ඉල්ලුවෙමි,

කොන්දෙස්තර මගේ මුහුණ පුදුමයෙන් බලා මෙ සේ කීවා: "මේ කොළඹ බසය! ඇයි දන්වීම නොබලා එල්ලුණේ? මෙය දූත් නවත්වන්නේ බම්බලපිටියේ. බහින්න අය ඉන්නවා නම් පමණක් දෙහිවලත් වැල්ලවත්තේත් නවත්වනවා."

"හොඳ යි එහෙනම් මට බම්බලපිටියට ටිකිත්තක් දෙන්න."

කොන්දෙස්තර සත පහළොහෙක ටිකිත්-තක් දික් කෙළේ ය. මම ඒ සාක්කුවට අත යැවවෙමි.; මේ සාක්කුවට අත යැව්වෙමි.

"මගේ අතේ ඇත්තේ සත පහක් පමණ යි" මම අමාරුයෙන් කීමි.

එ විට කෙනකුට බසිනු සඳහා රිය දෙහිවල මං සන්දියේ නැවැතුම් පොළෙහි නැවැත්විණි. කොන්දෙස්තර දෙසට සත පහ විසි කළ මම දෙහිවලින් පැනගත්තෙමි. එ ද මා ගෙදර ගියේ පයිනුයි.

(සත් වැනි ගොල්ල)

රුසැයුම් තරගය

දුහුනන් සඳහා යැ. දිනූ පබඳ පල වේ. තෑගි ලැබේ.

ගැදි තරගයට මැය –

දඹදිව්යන් හෙළදිවේ පිරෙනු බලා අද ගැමුණුවනට පහළ වන සිතිවිලි

තෑගි දෙන්නෝ –

මහනුවර, 'ධර්මරාජ' විදුහලේ, ඇදුරු, හරිශ්චන්ද්‍ර විජයතුංග සූරිහු යි.

පැදි තරගයට මැය –

කෙළිපිටියේ ම දවස ගෙවන දරුවකුට මවක කරන අවලාදය

තෑගි දෙන්නෝ –

මාතර, සාන්ත තොමොසු විදු හල්පති, කු. බේ. ජයසූරිය සූරිහු යි.

තරගයට එවන පැබැඳුම් සැප්තැම්බර 25 නො ඉක්මවා එවන්නැ.

එඩියට එවන සියලු පැබැඳුම් ගල්කිස්සේ, හුළුදගොඩ පාරේ 20/1 එඩියෙහි සකසුවන් නමට එවුව මැනැවි.

එඩි වැඩූම

සඟස්‍ය වෙසරද
සුනිල් සාන්ත

පුන- { එඩි වඩා - හෙළයනේ
ගැයිය { රකිවූ ඔපේ හෙළ නමේ

1. හෙළ නමේ ද දූළි ගගා
බඩ රැකැගන්නෝ
පරයන් ගේ පිහිට සොයා
දණින් ඇදෙන්නෝ

2. 'අපි හෙළයෝ වමු' කියා
මහ හඩ දෙන්නෝ
පරයන් ගෙන් වාසි ලබා
එ දෙසැ හැරෙන්නෝ

3. දෙස රැස බස නසන්නෝ
අපේ මේ රටේ
අප හට මහ වැඩ සාදන
ලොකු නිලදරුවෝ

4. අපේ බසින් දෙසදෙසා
දූයට සිනා සී
පරයන් හට ඉණි මං දෙති
ඇතැම් කපටයෝ.

ස	රි	ග	ම	—	—	ද	ප	ද	ස̇	—	—
එ	ඩි	ව	ඩා	—	—	හෙ	ළ	ය	නේ	—	—
V නි	V නි	—	ද	ප	—	ම	ග	ප	ම	—	—
ර	කි	වූ	ඔ	පේ	—	හෙ	ළ	න	මේ	—	—
ස	ස	ස	රි	රි	—	ස	රි	ග	ම	—	—
හෙ	ළ	න	මේ	—	ද	දූ	ළි	ග	ගා	—	—
ද	ද	ප	ම	ද	V නි	ස̇	—	—	—	—	—
බ	ඩ	රැ	කැ	ග	න්	නෝ	—	—	—	—	—
ස̇	ස̇	ස̇	V නි	V නි	—	ද	ද	ප	ම	ම	—
ප	ර	ය	න්	ගේ	—	පි	හි	ට	සො	යා	—
ග	ග	—	ස	රි̇	—	ම	—	—	—	—	—
ද	ණි	න්	ඇ	දෙ	න්	නෝ	—	—	—	—	—

ගැදි තරඟය

(දිනූ පබඳ)

කතරගමේ බලමහිමය

දෙහිවලැ
පාලිත කොහොන

හෙළ දිවට අරක් ගත් සතර වරම් මහ දෙවි කෙනෙක් වෙති. සමන්, උපුල්වන්, විබීසණ, කතරගම යන දෙවියෝ යි ඔහු. මෙයින් කතරගමේ බල මහිමය හෙළ දිව රක්නා අන් සියලු දෙවිවරුන් ගේ බල මහිම මැඩ ගෙන සිටින බව අමුතුයෙන් කියා දිය යුතු නො වෙයි.

ගැමුණු මහ රජුට එළාර දමිළ උවදුර මුද ලක් සසුන් රැකීමට කතරගම දෙවියන් ගේ පිහිට ලැබුණු බවත් එහි කළ ගුණ සැලැකීමක් හැටියට එ රජු කතරගම දෙවොල තනා හුවක් ඇයෙන මාගෙන් දුර බිම දෙවොලට පිදූ බවත් හුව යන්න ම ඌව වූ බවත් කට කතාවේ එයි. තොටගමුවේ සිරි රහල් මා හිමියන් ද කඳ සුරිඳුන් ගෙන් වර ලැබූ බවෙක් කියැවේ.

මේ පැරැණි කතා යි. එහෙත් කතරගම දෙවියන් ගේ බල මහිමය ගැන කියැවෙන අලුත් කතා හා සලකා බලන කල ඒ පැරැණි කතා ඇදැහීමට තරම් කරුණු ඇති බව පෙනෙයි.

කතරගම පෙදෙසේ සිදු වන ඇතැම් කරුණු මහ පුදුම එළවනසුලු ය. කතරගම ගොස් වනයේ අතර මං වූවනට බෙහෙවින් මං පෙන්වන්නකු ගේ හැටියෙන් දෙවියන් ගේ උදව්ව ලද බවට කතා බොහෝ ය.

කතරගම ගිනි පෑගීම ලොමුදැහගන්වන කරුණෙකි. ගිනි ගෙන දිළියෙන කිහිරි අඟුරු මැලයක් උඩින් පයින් ම යෑම කො තරම් පුදුම ද? ඒ ගිනි මැලයට ළං වීම තබා බලා සිටීම ද රුදුකර ය. එහෙත් ඒ ගිනි මත අප තණ පිස්සේ ඇවිදින්නාක් මෙන් සැදැහැවත්තු ඇවිදිති. ඇතැම් කෙනකු ගේ ඇඳි වත පවා ගිනි අඟුරු මත ගැවී ගෙන යනවා ද පෙනේ. ඇවිද ඉවර වූ විට යටි පතුල්හි පිළිස්සුණු බවට කිසි ම ලකුණෙක් නො වේ. මේ දෙව් බලය විනා අන් කවර බලයෙක් ද?

කතරගම පුදුම ගිනි පෑගීමට ම සීමා වූයේ නො වේ. ගතේ යකඩ උල් ඇන ගෙන බිම පෙරැළෙන සැටි දකින අපට හුස්ම ගැනීමට පවා අමතක වේ. මෙහි ද දෙවියන් ගේ පුදුම හාස් කමෙක් පවතී. එ නම් යකඩ උල් ගැලැවූ තන්හි තුවාළවල ලකුණු වත් නොපෙනීම යි. මෙය දෙවියන් ගේ බලය නො වැ හිතේ බලය බව සමහරු කියති. එහෙත් ඇහට කාවද්දන ලද යකඩ උල්වලින් ඇති වූ තුවාළ සිතේ බලයෙන් ලකුණකුදු නොපෙනෙන සේ වීමක් ගැන මම අසා නැත්තෙමි.

කාවඩි නටන්නෝ ද ඇතැම් විටැ ඇවිසුණු (ආවේස වූ) සැටියක් පා පෑ ගණන් නටති. ඔවුනට වෙහෙසෙක් නො දැනේ! සමහරු ඇවිසීමෙන් පේන කියති. එ සේ කියන පේන සැබෑ වූ වාර බොහෝ යි.

පෙරැ දී නම් කතරගම ගමනට ඇසළ මස ම නියම වී තුබුණේ ය. එහෙත් දැන් ඇසළ පෙරහර සමය සේ හැම ද මත් කතරගම ජනයා ගෙන් ඉස් පාසු නො වේ. මෙ සේ දිනපතා ම මෙ මහ සෙනඟ එහි ඇදෙන්නේ ද කතරගමේ බල මහිමය නිසා ම යි.

[සැලැ:- ගැදි තරඟය වෙනුයෙන් එවා ඇති පැබැඳුම් රැසෙකි. ඉන් දිනූ පබඳ යි ඉහළින් දැක්වුණේ. එහෙත් දෙ වැනි තැනට අප විසින් තේරුණ **නිහල් හෙපන්ස්තෝල්** ගේ පැබැඳුම ද ඇතැම් කරුණු අතින් ඉතා රසවත් යැ.

පහත පළ වනුයේ ඒ පබඳෙහි එන කතරගම දෙවි මහිමය දක්වන කතන්දර කිහිපයෙකින් එකෙකි. – සකසු]

II

රත්මලානේ
නිහල් හෙපන්ස්තෝල්

* * * *

කතරගම දෙවිඳුන් ගේ බල මහිමය පෙනෙන තවත් සිදු වීමෙක් දෙ වැනි ලෝ මහ යුද සමයේ දී සිදු විය. එ කල ලංකා යුද හමුදවට බැඳී සිටියකුට මිසරයේ සේවයට යන්නට සිදු විය. එහි සටන් කරමින් සිටි බ්‍රිතානි හමුදවට කෑම ගෙන යන ලොරියෙකින් යෑම ඔහුට හා ඔහු ගේ යහළුවකුට බාර කටයුත්ත විය.

හදිසියේ ම අහස් යානයෙක හඬෙක් ඇසිණි. ඒ සතුරා ගේ බෝම්බ යානා බව ඔහුට සිතිණි. ඒ සිතිවිල්ල සැබෑවට හැරුණේ ය. කරන්නට කිසිවක් නොපෙනුණු සිංහල සෙබළාත් ඔහු ගේ මිතුරාත් මොහොතින් ලොරිය යටට රිංගාගත් හ. සිංහලයා තමාට සිය ගම රට දී සුපුරුදු කතරගම දෙවියන් සිහි කොට බාරයක් විය. බෝම්බ පිපිරීම් නතර විය. වට පිට බැලූ ඔහුට පෙනුණේ පණ ඇතියකු හැටියට එහි ඉතිරි වී උන්නේ ඔහු පමණක් බව යි.

ආපසු ලංකාවට ආ හෙතෙම බාරය නිදහස් කිරීමට කතරගම බලා ගියේ ය. කතරගමට එන විට ඇඳිරි වැටී තිබිණි. ඔහුට වුවමනා වූයේ එ දින ම වැඩහිටි කන්දට යෑම යි. තමා හා එහි එන සේ නඩයේ කිහිප දෙනකු ගෙන් ඉල්ලා සිටිය ද එ වේලාවේ එහි යෑමට ඉදිරිපත් වූ කිසිවෙක් නො වී. සෙබළා තනි ව ම පිටත් විය. ඇඳිරියේ මං මුළා වූ ඔහුට යළි දෙවියන් ගැන සිහි විය. එ විට හුළු අත්තක් ගත් මහල්ලකු ඔහු ඉදිරියෙන් යනවා පෙනිණි. තමා යනුයේ ද වැඩහිටි කන්දට බව මහල්ලා ගෙන් කියැවුණෙන් සෙබළා ද ඔහු හා ම එහි ගියේ ය. කන්ද මුදුනට ළඟා වත් ම මහල්ලා ආ ගිය අතෙක් නො වී. මෙ පුවත එහි කපු තැනට කී විට ඔහු කියා ඇත්තේ ඒ මහල්ලා මිනිසකු නො ව කතරගම දෙවියන් බව යි.

* * * *

[තරගයෙන් තෙ වැනි තැනට තේරුණේ උණවටුනේ, මැටරඹෑ මියුරියල් උයන්ගොඩ කුමරිය ගේ පැබැඳුම යි. නිවැරැදි ගුණ-යෙන් ද, බස හැසිරවීමෙන් ද උසස් බවක් පෙන්වතුදු මෙ පබඳ ඇතැම් තන්හි මැයෙන් පිට යෑම මහත් අවාසියට සිටි බව කිව යුතු යි.

මත්තෙහි රුසැයුම් තරගයට පැබැඳුම් සපයන්නෝ මැයෙන් පිට නොයෑමට සිතට ගනිත් වා! – සකසු]

* * * *

"වදන් හිඟයක් ගැනැ වැලැපෙමින් ඇතැම්හු නුහුරු වදන් වදවන්නට වද විඳිති. සුදුසු අදිගියාව ඇති සුබැසියෝ ඒ ඒ සොයුන එකකු එකකු කරට ගෙනැ සැරැසෙත් වා! සුබස් කොසුයෙහි වදන් හිඟයෙක් නැති. කටයුත්තට එළැඹෙනු පමණ යැ වුවමනා. තුමූ මැ එති සුදුසු වදන්හු.

— කුමරතුඟු මුනිදස්.

[සුබස 3 වෙළුම, මහල් කලඹ (1941)]

පැදි තරගය (දිනූ පබඳ)

සරසවිය වත්මන් කිවියනට දෙන ඔවදන

— කුලියාපිටියේ රවීන්ද්‍ර තෙන්නකෝන්

බස් ලොව මහ සවිය
සරෙහි සවිය ය; ඒ බව
කිවියෝ ම වෙති දත්තෝ
බස මැනැවින් උගත්තෝ

එ බඳු කිවියන් හට
ලැබෙයි මා ගෙන් නෙ පිහිට
මම ය අදිපති කවියට
සරසවි නමැති සුරඟන.

'මම කවි ලියනවා
අපි කවි ලියනවා' ඇ
ලියනා වියරණ මරුවන්
හට මා පිහිට නො ලැබේ.

'කිරිය – කරු' යනා පද
සබඳ වත් ගළපනු බැරි
බොළඳුන් ද අද සරසවි
පට ලැබ කවි බදිනා හැටි!

එ ම සරසවී පටින්
ම නම ද කිළිටි කරමින්
බස ද කිළුටට ඇදලන
මුනට නිසි 'විය ගස' මැ යැ.

කවි මිනිසුට අරුත
පණ නල ය; රස මොළය ය
පද පෙළ සිරුර ය; ලකර
අබරණ ය කි කිවියෙක්

එ වැනි කිවියන් හට
මා ඇස ලැබේ දිව රැ
සිහිනෙනුදු නො දකිම වා
කුණු කවි බඳිනා බැළයන්

සබාවේ සිය වත
පාති හැදූණෝ හැඩ කොට
නොහොබනා තැන් දක්වන -
වුනට සබයේ ඉඩ නැති.

බබුරෝ අමු මස ද
බුදිති; හැදූණෝ එ මැ මස්
රස කැර බුදිති පලහා
බස රසයනු ද මෙ ලෙසිනි.

ඇතියෙන් මැ ය දුගඳ
බිහි වනුයෙ නිල මැසි රැළ.
වනුයෙති මා – පියන් දෙස
බිහි වනු නොසැබි කුකිවින්.

උන් බෝ වනු රටට
විපතෙකි කුණු කාණු වන්.
උයන් සිරි සර අයුරු ය
සුකිවි බමරුන් ඇති රට.

අරුත් යුත් හුදු එළි
ඇති කව් සුහු බවට ගිය
පොල් යැ පිටතින් නෙත් කලු.
කිම පල බිඳ බැලීමෙන්

නිසඳැස් නමින් පැදි
බඳිති එ නො වේ පැදි නම්.
හුදු කවි සිතුම් පමණෙකි
සිතුම් කවි නො මැ වන්නේ.

කිවියා ගේ සිතුම
අනුනුදු ඒ ලෙස ගන්වන
බලය වියරණයෙහි වෙයි
කිවියා ඒ උගත යුතු.

කව රස සිරිහර මැ
වියැ යුතු යැ යි සිතනුවෝ
වෙති, ඔහු ද සිය සිතැ ඇති
සැටියක් පවිනුවෝ වෙති.

කම නැති එක මැ රස
සිරිහර වුණා වේ ඒ
පවසනා බස 'තාත්තික
ලෙඩිනො'ත්පළ නො විය යුතු.

සිරිහරය මැ කැමැති
මුන් හට වරම් අප ගේ
දුනොත් අපට වුව ද ඒ
නපුරට සිටිනු නිසැක යි.

කැර කව සැබිහුරු ව
බස රැස දෙස පුබුදුවා
අමර වනා කිවියන් හට
ම – බැලුම් ඇලුම් නිසැක ය.

[තරගයට ලැබී ඇති පැදි පැබැඳුම් අතරේ දිනුම් තැනට හිමි කම් දැක්වූ එක මැ පබඳ මෙ වෙයි. පැබැඳුම් එවූ අප දුහුනා කිවියෝ මෙ පබඳින් ගුරු කම් ලබත් වා – සකසු]

දම් සක

වි. ජ. මු. ලොකුබංඩාර

සිදුහත් කුමරුන් වෙසක් ද ලැබූ බුදු නුවණ බුදු රජුන් ලොවට බෙද දුන් දිනය යි, ඇසළ පුර පසළොස් වක දවස. ඇසළ මලින් සුවඳ වන ලෝ තලය බුදුන් එළි පෙහෙළි කළ ඇත්ත සතර නිසා නවමු බවක් ලබයි. ලොවේ සියල්ලක් පුරා ඉතිරී, පැතිරී එහෙත් සැහැවී ඇති දුක පිළිබඳ සැබෑව සපුරා තේරුම් ගත් ගොයුම් මුනි තුමන් එ ද, ඇසළ හඳ නැඟෙන විටැ, ඒ විටැ තමන් පමණක් දත් ඒ ඇත්ත සතර ඇස් ඉදිරියේ මැ සැබෑ වන සැටි නහම-නහමා, බුදු රැස් විහිදුවමින් වඩිමින් සිටියේ බරණැස දෙසට යි. කෙනකු බුදු කැල්මෙන් බබළන එ තුමන් දෙස විමැසිල්ලෙන් බලද්දී, අයෙක් ගමන් තොරතුරු විමැසූ හ. සිනහ පිරි සිරි මුවින් ගිලිහුණේ–

“ලොවේ දහම් හඬ පවසනුව කසී රටට යෙමි” යනු යැ.

කසුප් බුදුන් ගෙන් මෙ පිටැ නොවිහිදුණු රැස් බරණැසැ ඉසිපතනයේ දී ඇහැළේ සඳ රැස් සමඟ මුසු වී යැ. “දුකට පිහිට දුක මැ යි – දුකින් මිදෙන මඟ දුක් විඳීමෙන් මැ ලබාගත යුතු යි” යනු පරම සැබෑව සේ ඇදහූ පස් වග මහණෝ ඒ පහන් මොහොතේ සඳ පානේ තමන් වෙත එමින් සිටි බුදුන් දැකැ සොම්නස් වූ හ. මිහි කත සනහ-සනහා එ සේ තමන් වෙත වඩිනා බුදුන් දැකැ - දැකැත් ඔබ පිළිගනු වෙනුවට “අප යන මහැ මැ යන්නට මෙහි එන සැටි පෙනේ දැ” යි අසන්නාක් මෙන්, ඔවුනොවුන් දෙසැ බලමින් සිටියෝ යැ. එහෙත් එ තුමන් ළං වත් ළංවත් මැ හිස නො නමා සිටිනු හැකි වූයේ පස් වග මහණුනට නො වේ. එ හෙයින් ඔහු බුදුන් වැන්දෝ යැ; බුදුන් පිළිගත්තෝ යැ; ගමන් පවත් විමැසූ හ.

සිරුරේ සවිය විය නො කැර, සසරේ බල දුබල කරනුව මැදුම් පිළිවෙත අනුවැ ගොස් සුජාතාවන් පිදූ කිරි පිඩු වළඳා, ගයා හිසැ ඇසතු ගස අසලැ හිඳැ - ගත් ද අලුයමැ අරුණ නැඟෙන විටැ සිත දියුණු කැරැගත් තමනට එ ද අරුණ නැගෙන මොහොතේ ඒ තෙක් ඔවුන් සෙවූ ඇත්ත කිමෙක් දැ යි වැටැහුණු බව බුදුහු පැවැසූ හ. පුහුදුන් ලොව බුදු බසට වුවත් දක්වන්නේ කවර තරමේ සැලැකිලි දැ යි දක්වන්නට දෝ, නැත හොත් තමන් මුලැ දී මැ බණ නො දෙසම් යි සිතීමේ නිවරද බව අඟවන්නට දෝ පස් වග මහණෝ ඔබ බුදු වූ බව වත් නො පිළිගත් හ.

එහි පුදුමයෙක් නැති. එ ද දඹදිවියෝ ද හෙරක්ලීසියන් කී පරිදි “රුවක් කැමැත්තෝ පොළොව යට හැරියැ යුත්තෝ යැ. එ සේ නොකරන්නෝ මිහි පිටැති පිදුරින් සැනැසියැ යුත්තෝ වෙති.” යනු මුඳුනින් පිළිගත්තෝ වූ හ. ගුරුවරුන් සිසුවන් සොයා උන් අබිමුවට එන සිරිතෙක් නො වී. එ හෙයින් බද්දිය, වප්ප, මහානාම, අස්සජි යන සතර නම මතු නො වැ, බුදු වන බව තිරයා මැ කී, කොංඩඤ්ඤයෝත් ගොයුමන් බුදු වූ පුවත සැක කළ හ.

ලෝ දහමට අනුවැ පමණක් නො වැ බුදුන් දෙසූ දහම් කඳ නොයෙක් නොයෙක් වෙස් ලැබී යැ; නො යෙක් අයුරු වෙනස් වියැ. වරෙකැ සුවාසූ දහසක් දහම් කඳේ පිළිල නැඟිණි. වරෙකැ බුදු දහම් රුකේ කොළ ගිලිහී ගියේ යැ. පලු හැලුණ ද, පල වැටුණ ද, දියත්තක් ළං කළ සැණින් දළු ලා ලිය ලා ළිදිරි වැඩී නැඟී සුහුඹුල් රුක් රඳනු වන පින එහි ඇතුළේත් ඇතුළේ ගප් වී තිබිණි. රට - රටවලට යන ඇත්තන් ඒ ඒ රටේ සිරිත් විරිත් අනුකරණය කරන්නා සේ බුදු දහම ද එය පතළ වි ගිය රටවලැ මිනිසුන් අනුවැ, වටපිටාව අනුවැ වෙනස් වී හැඩ ගැසිණි. දේසේ හැටියට බාසේ යනු පමණක් නො වැ ආගමය යනු ද සැබැවෙක්

වී යැ. එහෙත් කාලයා ගේ ඇවෑමෙන් සිදු වුණු ඒ මේ කිසි දු පෙරළියක් නිසා, වෙනස් නුවුණු මුල් බුදු දහම පිළිබඳ තතු සොයන මැදහත් උගත් කවුරුත් පිළිගනිත්, බුදුන් දෙසූ මුල් මැ බණවරේ – දම්සක් පැවැතුම් සුතුරේ - බුදු දහමේ හරය, මුල් ඉගැන්නිම්, ගැප් වී ඇති බව. එහෙත් විදු එළියෙන් පිරිසුදු වී ඇති අද, විසි වැනි සිය වසරේත් ඒ මහ විදුදර ගොයුම් මුනිඳුන් ගේ දහමට වැඩි ගරුවක් බුහුමනක් පානා බවක් පවසමින්, "ධම්ම චක්කය,, තේරුම් ගැනීමට තබා කියැවීමටත් තහනම් බණක් සේ සමහරු සිතති.

එ ද දඹදිවැ නිමිති කරුවන් ගේ බසට අනුවැ, සිදුහත් කුමරා එක්කෝ සක්විති රජකු වැ ගිහියකුට ලැබියැ හැකි උසස් මැ තනතුර දරන්නටත් නැත හොත් පැවිදි වී සියල්ල දත් උතුමකු වන්නටත් තරම් පින් ඇත්තෙක් වී යැ. සක්විත්තකු ගේ සලකුණ යි, රෝදය හෙවත් සක. සක්විති කම පැත්තකට ලා ඇත්ත සොයා දත් බුදුන් පැවිදි රජ දහනේ සක්විත්තා වීමෙන් පසු ඒ තනතුර ලැබීමේ අයිතිය අහවන සේසත- ඔප්පුව-වියැ, දහම් සක. බුදුන් සොයාගත් ඇත්ත සතරත්, අරි අටඟ මහත් ගැප් වුණු දම් සක් පැවැතුම් සුතුර – සිදුහතුන් දම් සක ලද බවට නො බිඳියැ හෙන සාක්කිය යි. එ හෙයින් දහම් සක- ධර්ම චක්‍රය- තේරුම් ගැනුම, එය නිරතුරු මෙනෙහි කිරීම, මහ මතුර - මන්තරය - ලෙසින් ජප කිරීම, අපේ හෙළ බුදුනුවන් වත් මේ පෝය ද සිටැ නම් පුරුදු කළ යුත්තෙක් මැ යි.

බුදුහු මෙ සේ දම් සක් පැවැතුම් සුතුරේ මුල පුරති. "ද්වේ මෙ භික්ඛවේ අන්තා පබ්බජිතේන න සේවිතබ්බා. යොචායං කාමේසු කාම සුඛල්ලිකානුයෝගෝ හීනෝ ගම්මෝ පෝථුජ්ජනිකෝ, අනරියෝ අනත්ථ සංහිතෝ." - යෝචායං අත්තකිලමථානුයෝගෝ – දුක්ඛෝ අනරියෝ අනත්ථ සංහිතෝ". මැදුම් පිළිවෙතේ අගය බුදු වන්නට පෙරාතු වැ මැ පිළිගත් ගොයුම් මුනිතුමෝ පැවිද්දන් ඇසුරු නො කට යුතු මං දෙකක් දක්වති. සැපෙහි මැ ඇලී ගැලී විසීමත්, දුකෙහි මැ කිඳී සිටීමත් යන මේ මං දෙක පැවිද්දනට පමණක් නො වැ, ගිහියනට ද කිසි සේත් සුදුසු නො වේ. සැම විටැ මැ සම බර වැ සිටිමේ අගය, මෙ ද ලොවට නම් අමුතුයෙන් කිව යුතු නො වේ. "අත්ථකිලමථානුයෝගය දුක යි" කී බුදුහු කම් සුව දුක යි නො කී නමුත්, එය සැපවත් බවක් නම් කැලමැ නො කී හ. මෙයින් මොනොවට පෙනේ, වදන් යෙදීමෙහි ලා, ඔබ වහන්සේ කෙ තරම් විමැසිලිමත් වූ සේක් ද යනු.

බුදුනුවන් වැඳිමට යා යුතු තැනක් සෙයින් මහ පිරිනිවන් සුතුරේ ද ඇඳින්වෙන සාරනාථයේ දි එ ද බුදුන් දෙසූ පරිදි අත්තකිලමථානුයෝගය දුක බව සිදුහතුන් ගේ දුකර කිරියා අවදිය දක්වෙන ගන්ධාර පිළිමය මොනොවට දක්වයි. ලොවැ සියල්ල පුරා මැ සැහැවී ඇති දුක පිළිබඳ කිසි දු තැකීමක් නැති වැ, සැපෙහි මැ ඇලී ගැලී හිඳීමෙන් සසරින් මිදෙනු නො හැක්කා සේ මැ දුකෙහි සැපයක් මැ දක්නහුට ද, සසර දුක, ඒ වූ, ඒ වන පරිද්දෙන් තේරුම් ගැනුම නො කට හැකි යි. එයින් වන්නේ සසර සරු වීම යි.

දුක් ගන්නා මහ මෙන් මැ සැප මැ අගයන මහ ද සවරද බව දක්වූ බුදුහු ඒ දෙ මහ මැ පිළිකෙව් කළ හ. එයින් එළි පෙහෙළි විණි, රුවන් වන් මැදුම් මහ; අරි අටඟ මහ. බුදු දහම සැබෑ ලොවේ දී වැඩට ගත හැකි බව, ගිහි පැවිදි දෙ පසට මැ අඩුවක් ලුහුඬුවක් නැති වැ නිවනේ දෙර ඇරී ඇති බව, අරි අටඟ මඟින් පෙනේ. නිවැරැදි වැටැහීම මුල් කොටැති අරි අට මහ අනුවැ යෑමෙන් නිවන් පසක් කැරගත හෙයි. තමා ගේ ගැලැවුම් කරු තමා මැ බව, අනියම් මඟින් පැවැසිමෙක් ඒ අරි අටඟ

මහ දිගේ ගියාහු රහත් (චීන - ලෝහන්, ජපන් - අරකන්) පදවියට පත් වෙති. ඒ වනාහි සිරුර සතප්පමින් හෝ සිරුර තවමින් හෝ ලැබියැ හැක්කෙක් නො වේ. සිරුර සතපා හෝ සිරුර තවා හෝ නිවන් ලැබියැ හැකි සේ ඇදහීම, මිනිසා සිරුර යැ යි අදහන්නකු විනා අන්කිසි බුදුනුවකු කිසි දු විටෙකැ පිළිගන්නා මතයෙක් නො වේ.

අංගුත්තර නිකායයේ කාලාම සුතුර දෙසූ බුදුහු අඳ අදහිල්ල හෙළු හ. දම් සක් පැවැතුම් සුතුරේ නිවැරැදි ඇදහිල්ල පැසැසීමෙන් පෙනෙනුයේ ද වැරැදි ඇදහිල්ලේ, අඳ බැතියේ දෙස් මැ යි. යමක් හොඳින් දක්වුව මනා තන්හි දී කළ යුත්තේ ඇස් පෑදීම යි. එ හෙයින් කිරි සුදු ඇත්තක් පැවැසීමට සැරැසුණු බුදුහු කිසි දු විටෙකැ අඳ බැතියාව නො ඉවැසූ. මිනිස් ඇසේ අළු ගසා ඇත්ත වසන් කරන ආරේ කෙනකු නුවූ එ තුමෝ එ තෙක් මිනිස් ඇස් පුරා තුබුණු අළු ද හැරැ-පූ හ. අනතුරු වැ පැවැසිණ, ඉතිරි ගුණ හත. 2. යහපත් කල් පනාව, 3. බොරු සතුරුව, 4. යහපත් වැඩ, 5. යහපත් දිවි පැවැත්ම, 6. නියම පැතුම 7. හරි සිහිය 8. සිත මනා වැ තැන්පත් කිරීම, නිවන් දෙරටුවට නඟිනට තැනුණු පිය ගැටපෙළක් මෙන් පැවිද්දටත් ගිහියාටත් නිවන් සුව විඳිනා මහ පාදයි.

මේ මගේ ගියෝ කිසි දු විටෙකැ වරද්ද - ගත්තෝ නො වෙත්. මෙ මැ මහේ මැඳුම් පිළිවෙතේ අගය අද ලොවැ මැදහත් උගත් කවුරුත් පිළිගනිත්. එ හෙයින් අරි අටඟ මහ ගැනැ විවරන කිරීම - පැහැදිලි සැබෑවක්, ලොව පිළිගත් ඇත්තක් අමුතු අබුතු නොවැටැහෙන සුළු ගුළු දහමක් බවට පෙරැළීමෙකි.

මේ පිවිතුරු ඇත්ත සතර. එ ද බුදුන් දම්සක් පැවැතුම් සුතුර වදරමින් එළි දක්වන්නට කලින්, එ කලැ කිසි දු කෙනකු නොදෙසූ බව බුදුහු ඉඳුරා මැ පවසත්. එ හෙයින් දම්සක් පැවතුම් සුතුර ඇති තාක් කල්, කිසි දු මැදහත් උගතකුට බුදු දහම හින්දූ දහමේ වෙනස් රූපයක් සේ හෝ එහි රිකිල්ලක් සේ හෝ සලකනු නොහැක්කේ යැ. ''පුබ්බෙ-අනනුස්සුත ධම්ම'' යනු මැ ඒ හඟවයි. මථුරායේ පිළිම කලාවට වඩා වෙනස් මහෙකැ ගොස් ගුප්ත යුගයේ පිළිමකරු නෙළු සාරනාත පිළිමයෙන් පිළිබිඹු වන අයුරින් එ ද එහි බුදුන් දෙසූ ඇත්ත සතර ලොව රක්නා සතර මහ දෙවියන් වැනි හෙයින් ඇත්ත අගයන්නෝ දම්සක් පැවැතුම් සුතුර උදේ හවස මෙනෙහි කළ යුත්තෝ යැ. එයින් විහිදෙන එළියෙන් සිය දිවි මහ ඔප් නංවා-ගැනීමට මේ ඇහැළ මහේ දී වත් අපේ බුදුනුවන් සිතට ගනිතොත් එය මැ හෙළදිවේ අමුතු එළි පෑදුමක් වනු එකති.

'සසර මහ පව පඳුරු මුල නම්
අවිදු පස මැ යි දැනැ වදරා
නැණෙ'ළියෙන් දුක් නසන මහ පැ
සමන්බහදුරු බස දිළේ වා!'

(- දෑ විනය)

කඳ දෙව් තොහුව

පුන ගැයිය
මෙහෙසුරු හෙළි'සුරනට පුත්
කඳ හෙළ දෙවිඳාණනෝ
හෙළ දෙව් ගහ ගණ මැද බැබැ-
ළෙන එක දිනිඳාණනෝ

ස-මලින් ලත් කිරුළු දරා
සවන් නමින් පළ වැ පුරා
හෙළය වැවූ ඔබ සමරා
අද ද ළැහෙමු සතොස කරා
ඔබට දිගා වේ!

දහ තුන් දහසක් හවුරුදු
අතර'තුරේ හෙළයට රුදු
පැමිණි සතුරු උවදුරු කඳු
බිඳැ-ලූවෙක් කොහි ඔබ බඳු
ඔබට දිගා වේ!

සහදෙව් හෙළ හතුරු රද
යුදට රුහුණු පැමිණුණු ද
කර බා-ගෙනැ එඩිය මුද
ගිය හැටි ඔබ තෙදින් දද
ඔබට දිගා වේ!

එළාර උවදුර දුරු කොට
බලය එළා ගැමුණුවනට
හෙළ දිව රැකැ-දුන් ඔබ හට
නැමෙමු නැමෙමු අපි හැම විට
ඔබට දිගා වේ!

එක හී පහරින් එ ලොවට
බල්ලුකයා දක්කන්නට
පුස්දෙව් අප සෙනෙවිඳු හට
බල දුන් හැටි බලා නො සිට
ඔබට දිගා වේ!

නැවැවූ හෙළ රජ රුකඩ
පොත්තකුට්ටයා බල මැඩ
මානවම්ම කුමරුට ඉඩ
ගෙනැ-දුන් හැටි දී වර දිඩ
ඔබට දිගා වේ!

දළ සලයත් අළ සැරයේ
ඇරියුම ඔබ කතට ගියේ
නොදහම් පොත් හළු වැ- ගියේ
දහම රැකිණි යළි හෙළයේ
ඔබට දිගා වේ!

සිටි පසළොස් වැනි වයසේ
රහල් තෙරුන් හට රිසි සේ
දී වර, කිවි බවට එ සේ
ඔබ කළ වැඩ අද ද දිසේ
ඔබට දිගා වේ!

— (ගහේ ගිය මිණ)

* * * *

ගෝළයා — 'ගුරුතුමෙනි, බලන්න අර දැන්වීම! 'අන්ත්‍රාදයක යි.' කිමෙක් ද එහි තේරුම?

ගුරුතුමා — 'එය තේරුම් ගන්න ටිකක් අමාරු යි. ඒ තමා රජයේ සිංහලය!'

ගෝළයා — 'ඉතින් එහි තේරුම?'

ගුරුතුමා — 'ඔන්න අසාගන්න. අන්ත්‍ර - ආදය - කයි. 'අන්ත්‍ර කියන්නේ බඩවැල්; ආදය - ඇද; කයි - කනවා!'

සෝරත නා හිමි සමරුව

වියත් කම් කතරේ ලක් දිව
    ගැලූ වන් නදියක් තුමුල්
අස්වැද්දූ සිය බස් කෙත් වත්
    පිටාර ගලමින් නොමින් —

දිසා පාමොක් ගුරුන්දැ වූ
    හෙළ දිව් තක්සලා බිමෙ
දසින් බැඳි පියල්ලක් වන්
    සිප් සත් ලොල් යැදි පෙත් මහේ—

වැස්සේ නැණ නිමිත්තක් වූ
    අඹරේ විදූ අත් දනන්
මේ කුළක් අයුරින් වී සිප්
    සත් උයන් පිනවා වැවූ—

ලක් සසුන් සයුරේ දිස් වූ
    නැවක් වන් සිල් රුවල් උදූල්
පිළිවෙත් හබලින් යා ගත්
    සග මොක් තොටු යා කොටින්—

මිනිස් කම් පතලින් ලත් ලක්
    වැස්සන් ගේ කුසලින් මෙ ද
අගනා රුවනෙව් දූල් වූ
    ලක් මා උර තෙලේ ළකල්—

කයින් අස් වූ නමුත් අස් නූ
    කිත් යසස් සිරුරින් සද
'සුමඟුල් නම් වදන් මල්නෙත්'
    හෙළ බස් මල' සූන් සද—

සෝරත නා හිමින් දෙව් ලෝ
    වැඩියා වූ වියෝ දුකින්
දික් කල් දික් කල් සුසුම් ලත්නි.
    එඩියක් වලපී මෙ සේ.

සුබ පැතුම

එඩියෙහි සතුටට පිපුමට කරුණු වන විවා මඟුලෙක් අගෝස්තු 9 වැනි ද — සිකුරා ද, උණවටුනේ දී සිදු වියැ.

පතියා මාතර සඳදස් කෝපරහේවා සූරීහු යැ. පතිනිය් උණවටුනේ ඇඩිලින් අලුත්ගම හේවා කුමරියෝ යි. දෙ දෙනා මැ එඩියේ හිතවත්තු යැ.

කෝපරහේවායෝ ගල්කිස්සේ සාන්ත තොමොසු විදුහලේ ඇදුරු මඩුල්ලේ වෙති. මාතර සාන්ත තොමොසු විදුහලෙන් ඉංගිරිසි අදියෙවුම පිරූ ඔහු පාලිය, අභංගමැ විදුසද පිරුවන් පති, කෝදගොඩ නැණලු පඩිහිමි පාණන් ගෙන් ද සමය දැනුම සිය මයිලණු වූ පඹුරනැ මෙතේ හිමියන් ගෙන් මෙන් මැ විදුරු අරම පති වැ විසූ පැළැනේ සිරි විදුරු නැණ මහ නා හිමියන් ගෙන් ද ලබා කුමර තුඟු මුනිඳසුන් ගේ සුබසින් හෙළ කව් ලොවට පළමු පිය තැබූ හ.

පිය වියොව, මෙත් හිමි සමරුව් ඇ ඔවුන් ලියූ පැදි පොත් කිහිපයක් මැ නව මැ නොපළ වැ සිටිය ද පැබැඳුම් ලෙසින් පත් සහරා මගින් පළට ගිය පැදි පැබැඳුම් ගණන ගණන් පතා සිටී. විලෙන්ස්කි ගේ යුරෝපා කලා යටගියාවට ඔවුන් කළ පෙරළිය හා හෙළ කලා සසඳුව සිත්තම් කලා ගුරු අත් පොතක් ලෙස අදියෙවුම් මඩුල්ලේ පිළිගැනුම ලද පොතෙකි.

කෝපරහේවා යුවළ ගේ මේ බැඳුම ඔවුනට මෙන් මැ හෙළ තෙරුවනට මහත් වැඩ පිණිසැ වේව යි එඩිය මේ මඟුල් අවසරෙහි සුබ පතයි.

TECHNICAL TERMS AND SINHALA

By
AELIAN DE SILVA
B. Sc. (Eng) A. M. I. E. E. Chartered Electrical Engineer.

Technical terms are by no means few. Their numbers may be in the region of several hundreds of thousands. Therefore the compilation of a glossary of Sinhala technical terms will, of necessity, take a considerable amount of time. Even so, it may not be possible to obtain a satisfactory glossary which lives up to the task of expressing precise scientific ideas if the formation of the terms have not follwed a methodical process and a logical pattern in keeping with the genius of the Sinhala language. The haphazard borrowing of words and adhoc adjustments to the meanings of existing words will hardly yield a glossary suitable for scientific and technical work. It will remain a mere conglomeration of words, lacking among other desirable features even a semblence of consistency. Let us for the sake of argument contend, that for some reason or other we are prevented from borrowing words from other languages. Is it then the position that Sinhala is incapable of evolving its own language of science? We were never a nation of dumh people! Surely, the language of a nation who are credited with Civil Engineering achievements of no mean order, should be capable of producing all words that are necessary.

For instance consider an implement such as the plane used by carpenters. Also suppose we have no word in Sinhala to denote this implement. We can of course borrow directly from English and call it a "ප්ලේනය" or seek the aid of Sanskrit. But consider for a moment, how the Sinhala men of days gone by met the situation. Basing on the Sinhala verb "යත්" which means to "push" forward or "impel" he produced the term "යත්ත." For him the "mallet" was "අතකොළුව" "අත" being the "hand" and 'කොළ' being "to beat". The fisherman having observed the abundancy of bones in a particular fish named it "කටුවල්ලා." The breach the farmer made to let off the water for purposes of sowing was named වප් + කඩ, වක්කඩ and the still smaller breach (කඩ + ඉති) "කඩිත්ත." No one referred to the bull as වෘෂභයා or to the tree as a වෘක්ෂය. ගොනා and ගහ served the purpose fully. ඇතා was preferred to 'හස්තියා' බල්ලා to සුනඛයා and මාළුවා to මත්ස්‍යයා Cannot we, for our part, be satisfied with "පොල්තැරිය" in place of "නාරිකේල මණි-බද්ධ පුෂ්ප වක්‍රය?"

Be that as it may, what if any, are the particular advantages gained by basing the terms on Sanskrit? One is tempted to answer, "None at all." On the other hand, the disadvantages are many and merit discussion. Unlike English, Sinhala is to a large extent an inflected language. The Sinhala nouns are declined and the verbs conjugated. Due to this feature borrowed verbs do not take root in the Sinhala language as verbs. An example best illustrates the point. "පරීක්ෂා" is a term that has a Sanskrit origin and in that language it takes the form of a verb. However, when it gets into Sinhala it does not exist as a verb, for we cannot say, for instance, "ජෝ පරීක්ෂායි" It has to be "ජෝ පරීක්ෂා කරයි." In order to use this borrowed word an additional Sinhala verb had to be introduced–namely "කරයි." Thus the single English verb "Inspects" has to be represented by two terms in Sinhala. As mentioned earlier, even in English, the scientific vocabulary is extremely large and under these circumstances the resulting Sinhala scientific vocabulary will be considerably large. We would have to manoeuvre an unnecessarily large vocabu

lary whose abundancy of terms contribute in no way to any functional advantage. On the other hand, if the Sinhala verb be used, "He inspects" could be rendered in Sinhala as "ඔහු පිරික්සයි" instead of "ඔහු පරීක්ෂා කරයි" Even this simple example illustrates the resulting economy in word usage.

Further, the Sanskrit form of the word is invariably much longer, comparatively more difficult to write or pronounce. Consider the few examples given below.

පාඨශාලාව	-	පාසල
විද්‍යාලයය	-	විදුහල
ශීර්ෂය	-	හිස
මාර්ගය	-	මඟ
ව්‍යවහාරය	-	වහර
සුක්ෂ්ම	-	සියුම්
ඥානය	-	නැණ
ධෛර්‍යය	-	දිරිය

The above also illustrates the intricate letter combinations that are prevalent in the words borrowed from Sanskrit. There appears to be a very liberal use of the hard sounds such as ඩ, ඪ, භ, ඞ etc, and very often letters perform such antics as riding piggyback on one another. These features make writing and especially typing a nightmare. The typewriter itself has to be designed not only to accommodate a large number of characters but also to handle intricate operations. The use of Sinhala words whilst obviating these difficulties will demand only a mere thirty three odd characters in place of the usual fifty four. Considering the fact that no space needs be allocated for capital letters in the case of Sinhala it should be possible to design a type writer of very small proportions caphle of easy operation. In such an event the cost of the Sinhala type writer will be appreciably reduced and the speed of operation will be considerably increased. This is a very important aspect as the type writer is an instrument which plays an important role in both business and industry.

From a rational stand-point there are many other reasons which illustrate the advantages that would accrue if Sinhala terms be used But for the present let us presume that the use of borrowed words is discouraged. The question then aries as to how it is proposed to meet the demand for thousands of Sinhala technical terms. It is futile to imagine that a comprehensive answer to this question is possible within the compass of a short article of this nature. Nevertheless, an attempt can be made to discuss on broad lines how the problem could best be approached. Consider for instance, a very common word such as "කම්මුල" meaning a "cheek." The base of the ear is කන් + මුල and fuses to produce "කම්මුල" The butterfly has two equal antennae or two equal tubes. that is සම + නළ. It is therefore appropriately called a "සමනළයා." The caterpillar has an abundancy of thick hair on its body and gets as his name දළ + ඹු or "දළඹු." In Sinhala "ඉති" means "in this manner" and "ඉහත්" means "the past." Therefore ඉති + හත් would mean "the past was in this manner" ඉති + ඉහත් becomes ඉතිහත් or ඉතිහස් and means 'history.' "සර" is to go about and "යටිය" means a "stick." සර + යටිය becomes "සරයටිය" and then "හැරමිටිය" or "walking-stick." "හැව" means a "dead body" and "දර" is to "carry." The bierry is therefore appropriately termed a "දරහැව." "දා" means 'relics' and "ගබ" means a "chamber'; resulting in the word "දගබ." "කී" is "what was said" and "කරු" means a "doer." Therefore one who does what he was told to is described as "කීකරු" or "obedient." "පෙර" is "forward and "සර" is to "go." Thus "පෙරසර" or 'පෙරහර' means a "procession." Fog in Sinhala is "මිදුම" or මිහි + දුම literally "smoke on the ground." "ඉඩ means space and 'ම' means the very same and we get the word 'ඉඩම' where as 'කඩ' is to 'break' and we get 'කඩම' meaning an 'allotment." 'අවුළු' means food and 'හෙළ' means 'Sinhala.' Combining the two we get 'හෙළ + අවුළු' - 'හෙළවුළු' එළවුළු literally 'the Sinhala food.' There is no end to this process. It embraces practi-

cally every field: 'whether it be a name of a person, place or thing.

Here, two or more basic words which individully describe separate attributes of the object or action under question fuses to form an entirely new word which in turn goes to deocribe that object or that action. This obviously is a definite process or pattern and we could easily keep to this process and produce entirely new words. Say, for instance, we require a Sinhala word for the word 'Turbine'. For a moment it appears a very difficult task. But let us fall in line with the pattern we have already described. A turbine rotates and this rotation is imparted to it through the medium of its blades: In Sinhala "බම" is to rotate and "තල" means blades. Therefore.

"තලින් බමනුයේ - තලබමනය or Turbine.'

Now let us consider a different process altogether. In Sinhala "ගඳ" means a smell. a bad smell is "දුගඳ"and a good smell is "සුගඳ." Here we have added 'දු' in the first instance and changed the shade of meaning of the base word "ගඳ" in one way and in the second instance we have added 'සු' and altered the shade of meaning in a different way 'සු' and "දු" are called prefixes. The addition of a prefix to alter the meaning of a word is a definite process which is widely used not only in Sinhala but slso in very many other languages. English is a case in point. How extensively and effectively this process has been used in Sinhala can be understood from the followidg example where a series of prefixes have operated on one single verb 'ගත්' meaning 'te take.'

		ගනී - to take
උ + ගනී	-	උගනී - to learn
ස + ගනී	-	සගනී - to welcome
නි + ගනී	-	නිගනී - to abuse
පිළි + ගනී	-	පිළිගනී to receive
අනු + ගනී	-	අනුගනී to favour
පි + රිගනී	-	පිරිගනී to acquire

This process can be effectively used in our quest for new words. For instance, say we require a Sinhala word for "to modulate," We modulate one frequency with another or we mix so to say two frequencies. Modulation however is not pure and simple mixing. It is much more than that, it has very special features. If it were a case of mixing we could have used the Sinhala verb "හනයි" meaning "to mix." Therefore, in order to differentiate it from mere mixing we add the prefix "පිරි,' Then we get 'පිරි + හනයි' or "පිරිහනයි'

Let us examine yet another definite process which has been extensively used in Sinhala. In this case a particle is added to the end of the base word and it is known as a suffix. One meaning of the Sinhala suffix "අටි" is "similar to." Thus we have, දිගට හුරු වූයේ - දිගු + අටි—දිගටි මොලොකට හුරු වූයේ-මොලොක් + අටි—මොළකටි

This process also comes very handy in the formation of new words. Consider for instance the word "gland" used in mechanical engineering. This is something similar to a neck or throat. The Sinhala word for throat is "ගල." To convy the idea that it is something similar to a throat we make use of the suffix "අටි"

ගල + අටි - ගලටි

Thus the equivalent of "gland" will be "ගලටිය"

Though there are several other definite patterns or processes, space does not permit any reference to them. However, the three processes discussed earlier are sufficient to illustrate the existence of definite patterns and the fact that they could be easily made use of to effectively meet our present needs. All three processes are based on the permutation and combination of verbs, nouns, prefixes suffixes etc. There are in Sinhala several thousand verbs and nouns, twenty prefixes and several suffixes. If only ten numerals could combine to give the numbers in an infinite number system the verbs, nouns, prefixes and suffixes at our disposal should adequately meet our requirements of forming a comprehensive Sinhala technical glossary. If the new words be formed in this manner, the existing words and those that are newly formed will then intermingle with ease and in whatever sphere they be used a common tnread will be seen running through them: and it will be a glossary of this type that could be termed truly Sinhala.

නිකිණි මස

කුඹුරු අස්වැන්න එළැවූ මස ඇසළ බව අපි කීමු. එ සේ එළැවූ අස්වැන්න කපා පාගා – ගන්නා අපේ ගොවියා ඊ ළඟට කරන්නේ ඒ අටු-කොටුවලට යවා පිදුරුත් මඩුවල පුරවා කමත් අස් කොටැ පිරිසුදු කිරීම යි. එන මසේ – බිණරයේ-වැසි ඇරැ-ඹෙන නිසා මේ කමත් අස් කිරීම නිකිණියෙහි මැ කළ යුතු වෙයි. වැස්ස පිළිගන්නට වැව් සොරොවු පාද පිරිසුදු කිරීම් සඳහා ද කෙත් කමින් ඉසිඹු ලැබෙන මේ මස ඔහුට ඉඩ ඇත්තේ යැ. ඇතැම් විටැ යල් ගොවිතැනින් ඔහුට ඉසිඹු ලැබෙන දුරුත්තෙහි මෙන් මාස් ගොවිතැනින් ඉසිඹු ලැබෙන මේ නිකිණියෙහි අර කී විදියේ පිරිසුදු කිරීමේ කටයුතුවලැ ඔහු යෙදෙන්නට ඇති. වැ පකුලේ රැස් වන බොරත් වැ පිටැ තද වී දිය බැසීම වළකන කුණු රොඩුත් අස් කිරීමට අපේ පැරැණියන් අතංගුවෙකැ හැඩය ඇති සරළුව. නම් උපකරණයක් යෙදූ බවටත් ඔරුවලැ නැඟී ගොස් ඒ කටයුත්ත කළ බවටත් පිළිගැනීමට තරම් කරුණු ද අද අපට වන්නේ යැ. පිරිසුදු කෙළේ – කුණු නැති කළේ – මේ නිකිණියෙහි මැ යැ.

මහණ පැවිද්දන් ඇති වීමට පෙරැ සිටැ මැ මෙහි තවුස් පැවිද්දන් විසූ බවට කරුණු නොයෙක් ලෙසින් අපට ලැබේ. එ බඳු මුනිවරයන් කැලැ පෙදෙස්වලින් නික්මී වස් සඳහාත්, ලුණු ඇඹුල් සඳහාත් ගම් බලා එන්නට ඇත්තේ වැසි මස ලබන්නට පෙරාතු වැ ලැබූ මේ නිකිණියේ මැ වියැ යුතු. එ සේ හේළි තවුසන් වඩනා හෙයින් ද මහ තොටැ කසළ පියාලීම ඇතැම් විටැ අපේ පැරැණි හෙළයන් කළ හ යි ද සිතියැ හැකි. ඒ අයුරින් මේ මස අපේ පැරැණියන් පිරිසුදු (ශුද්ධ) මසක් ලෙස සැලැකුවා ද යනුත් අපට සැක පිටැ සිතීමට ඉඩ ඇත්තේ යැ.

කෙසේ වුව ද නිකිණි යන්නෙන් අපට හැඟී යන්නේ කුණු නැති (පිරිසුදු, හේළි) මස යන තේරුම යි. එහි නිපැදියාව මෙ සේ යැ.

නු + කුණු = නුකුණු = නිකිණි. කුණු නුවූ යන අරුතෙහි වූ නු + කුණු යන දෙ වදන එක් වී නුකුණු වීමේ නියර මැ, මැදින්, පොසොන්, යන නම්හි ද බල පා ඇති සේ අපි දකිමු. එහි 'නු' යන්නෙහි නිපැදියාව නො වූ = නුවූ = නු යනු යි. එ හෙයින් නු + කුණු යන්නෙහි අරුත කුණු නුවූ හෙවත් පිරිසුදු හෙවත් හේළි යන්න මැ යි.

'නුකුණු' 'නිකිණි' වීම ද රුහිරු = රිහිරි, 'කුහුරු = කිහිරි, කබලු – කැබැලි ඈ තැනින් මතු වී පෙනෙන අ, උ, ඔ අකුරු පිළිවෙළින් ඇ, ඉ, එ, බවට නැමීමේ නොනැම් අදෙස් (අනම්‍යාදෙශ) විදිය යි.

නිකිණි යන පදය අන් ලෙසෙකින් වූ සැටියක් දකින්නෝ ද වෙති. ඔවුන් කියන හැටියට අකුණු හෙවත් හෙණ නුවූ මස නු + අකුණු යි; නුකුණු යි. ඒ නුකුණු යන්න 'අනම්‍යයෙන්' නිකිණි වෙයි. එහෙත් අකුණු සැබැවින් මැ එන්නේ ඊ ළඟ බිණරයෙහි යැ. එ හෙයින් අප ගේ අදහස නිකිණි යනු නු + කුණු යන්නෙන් නැඟුණු කුණු නැති මස – පිරිසුදු මස – හේළි මස යන අරුත වියැ යුතු බව යි.